# පොළොන්නරුව යුගයේ රාජත්වය සහ භික්ෂු ශාසනය අතර පැවති සම්බන්ධතා පිළිබඳ ඓතිහාසික විග්‍රහයක්

## A Historical Analysis of the Relationship between Kingship and Buddhist Monks of the Polonnaruwa Period

මහාචාර්ය එන්. ඒ. විමලසේන

**Abstract**

The organization and collective attempt to the centralization of a country which has been done by the religious sections is not a simple task. Religion has played a remarkable role in shaping every society to become an ethically and morally sound one. As Brāhmanas have made many contributions to making Indian society better, the Buddhist monks have contributed in many ways to developing the nation's society in ancient and medieval Sri Lanka. Religion helps establish and continue spiritual lives of people which inherently help the ruler of the country to rule smoothly. Therefore, kingship and religion are very important aspects of a country for the continuation of ruling methods. This research mainly focused on the relationship between Buddhist monks and kingship in the Polonnaruwa kingdom, especially paying attention to the reigns of Kings Vijayabāhu I, King Parākramabāhu I and King Niśśaṇkamalla. These three kings appeared as major icons in this period. The study examines the relationship of these kings with the Buddhist monks in developing Buddhism in Sri Lanka. It also examines the ways in which the Buddhist monks reacted to these endeavours of the kings during

the Polonnaruwa period. The research problems of this were mainly recognizing the nature of these relationships, and attempting to identify the issues and problems of these relationships to understand if those relationships are characterized by arrogance or friendship. The proposed study will add to the existing body of knowledge as the existing studies have not fully paid attention to this matter. The study uses both primary and secondary sources for analysis.

**Keywords**: King Vijayabāhu I, King Parākramabāhu, King Niśśaṇkamalla, Kingship, Buddhist monks

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ඉතිහාසයේ පොළොන්නරුව යුගයේ රාජත්වය සහ බෞද්ධාගම අතර පැවති සම්බන්ධතා පිළිබඳව විමසුමක් කෙරෙන මෙම ලිපියෙහිදී ලංකා ඉතිහාසය තුළ පොළොන්නරුව යුගයක් වශයෙන් ගෙන සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් කරුණු කීපයක් මෙහිදී මතු කළ යුතුය. ලංකා ඉතිහාසයේ යුගකරණය සම්බන්ධයෙන් ශාස්ත්‍රඥයින් ගණනාවක් අදහස් ප්‍රකාශ කර තිබේ. මේ පිළිබඳව අදහස් දක්වා ඇති ශාස්ත්‍රඥයින් අතර ආර්. ඒ. එල්. එච්. ගුණවර්ධන සහ අමරදාස ලියනගමගේ ප්‍රධානත්වයෙහි ලා සැලකිය හැකිය. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන සිය අනුරාධපුර යුගය නමැති ග්‍රන්ථය සංස්කරණය කරමින් එම සංග්‍රහය අනුරාධපුරය නමින් හඳුන්වා ඇතත් එසේ ඉතිහාසය යුග වශයෙන් වෙන් කිරීම එතරම් ප්‍රඥාගෝචර නොවන බව සඳහන් කර තිබේ (ලියනගමගේ සහ ගුණවර්ධනල 2014: xxxv). සිංහල රාජධානියේ අගනුවර අනුරාධපුරයෙන් පොළොන්නරුවට මාරුවීම සැලකිය යුතු දේශපාලන සිද්ධියක් වුවද පොළොන්නරුව අවධියේ දක්නට ලැබෙන්නේ අනුරාධපුර සංස්කෘතියේ විකාශනයෙහි එක් අවස්ථාවක් පමණක් බව ඔවුහු සඳහන් කරති (Ibid., xlix). එමෙන්ම පසුකාලීනව ආර්. ඒ. එල්. එච් ගුණවර්ධන Peridization in Sri Lankan History Some Reflections with Special Emphasis on the Development of the State යනුවෙන්

ග්‍රන්ථයක් කරමින් දැනට පවතින ශ්‍රී ලංකාවේ යුග බෙදීම සම්බන්ධයෙන් සිය අදහස් ප්‍රකාශ කර තිබේ (Gunawardana, 2008). මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකා ඉතිහාසයේ යුග බෙදීම රාජ්‍යය වර්ධනය පිළිබඳ විශේෂ අවධාරණයට ලක් වූ අදහස් ගොනුවක් මැයෙන් සිංහල භාෂාවට පරිවර්තනය කර තිබේ. (විමලසේන 2022). එහිදී දැනට පවතින යුගකරණය සම්බන්ධයෙන් දක්නට ලැබෙන ගැටලු පැහැදිලි කර ශ්‍රී ලංකා ඉතිහාසය සම්බන්ධයෙන් නවතම යුගකරණයක් පිළිබඳව ඔහු විසින් අදහස් දක්වා තිබේ. එහිදී ඔහු නවතම ආකාරයේ යුග අටක් පිළිබඳව අදහස් ඉදිරිපත් කරයි. ඔහුගේ එම යුගකරණයට අනුව පොළොන්නරුව යුගය අයත් වන්නේ ආදි මධ්‍යතන රාජ්‍ය සහ ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානියෙහි ආරම්භය නමැති අවධියටයි (විමලසේන 2022: 40-45). එනම් ක්‍රි. ව. නවවැනි සහ දහතුන්වැනි ශත වර්ෂයන් අතර යුගයයි (විමලසේන 2022: 43). කෙසේ වෙතත් එම අදහස් තවම යෝජනා මට්ටමේ තිබෙන අදහස් වන අතර ප්‍රායෝගිකව භාවිතයට ලක් වී නොමැත. එමෙන්ම වින්සන්ට් පණ්ඩිත විසින් අදහස් කරන අන්දමට පැරණි රජ පවුල්වල දියුණුව හා පරිහානිය අනුව ලංකා ඉතිහාසයේ නොයෙක් යුගයන් වශයෙන් බෙදා නම් කිරීමට උගතුන් ලැදි වුවද එවැනි සීමාවක් තුළ පිහිටා ලංකාවේ බෞද්ධ ඉතිහාසය පිළිබඳව අදහස් දැක්වීම පහසු නොවන බව විස්තර කරයි (පණ්ඩිත 1962: 132). එම උත්සාහය යුක්ති සහගත වන්නේ රජ පවුල්වල දෛවය මත සසුනේ ඉරණම ද බොහෝ දුරට රඳා පැවති හෙයිනි. එම නිසා පොළොන්නරුව යුගය යුගයක් වශයෙන් ගෙන කරුණු ගෙනහැර දැක්වීමෙහිදී විවිධ ගැටලු මතු වුවත් ඉගෙනීමේ පහසුව සඳහා සහ මෙම අධ්‍යයනයෙහි පහසුව සඳහා පමණක් පොළොන්නරුව යුගය යනුවෙන් සඳහන් කරන බව විශේෂයෙන්ම මෙහිදී සඳහන් කළ යුතුය.

### සාහිත්‍ය විමර්ශනය හා පර්යේෂණයේ වැදගත්කම

පොළොන්නරුව යුගයේ රාජත්වය සහ බෞද්ධාගම අතර පැවති සම්බන්ධතා පිළිබඳව විමර්ශනයට ලක් කරනු ලබන මෙම ලිපියෙන් ප්‍රධාන වශයෙන්ම පළමුවැනි විජයබාහුල පළමුවැනි

පරාක්‍රමබාහු සහ නිශ්ශංකමල්ලගේ රාජ්‍ය කාල පරිච්ඡේදයන් පිළිබඳව විමසනු ලැබේ. සාහිත්‍ය විමර්ශනය සම්බන්ධයෙන් විමසා බලන විට පැහැදිලිවම පෙනී යන්නේ මෙම මාතෘකාව සම්බන්ධයෙන් ශාස්ත්‍රඥයින් වැඩි දෙනෙකුගේ අවධානයට ලක් වී නොමැති බවයි. නමුත් ඔවුන්ගේ ප්‍රධාන පර්යේෂණ මාතෘකා සාකච්ඡාවට භාජනය කිරීමේදී එහි කොටසක් ලෙසින් මේ සම්බන්ධව තම අවධානය යොමු කර තිබේ. එස්. ඩී. සපරමාදු විසින් සංස්කරණය කර තිබෙන පොළොන්නරුව යුගය කෘතිය තුළ එක් පරිච්ඡේදයකින් පමණක් පොළොන්නරු යුගයේ බෞද්ධ තත්ත්වය පිළිබඳ සාකච්ඡා කර තිබේ (imrudÿ 1962). නමුත් මෙම ලිපිය තුළින් ඔහුගේ වඩාත් අවධානය යොමු වී ඇත්තේ පළමුවැනි විජයබාහු පළමුවැනි පරාක්‍රමබාහුගේ කාර්යයන් සම්බන්ධවය. එමෙන්ම මෙහිදී මාතෘකාවෙන් බැහැරව අනුරාධපුර යුගයේ සිටම කරුණු සාකච්ඡා කර තිබේ. හාන්දුපැල්පොල පුඤ්ඤරතන හිමියන් විසින් රචිත පොළොන්නරු යුගයේ ලංකාව නමැති ග්‍රන්ථය තුළින් වඩාත්ම දේශපාලන ඉතිහාසය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර එහිදී ආගමික තත්ත්වය පිළිබඳව විස්තරයක් ද කර තිබේ. නමුත් පොළොන්නරු යුගයේ රාජත්වය සහ භික්ෂුත්වය අතර පැවති සම්බන්ධතාවය පිළිබඳව ද එය ක්‍රියාත්මක වූයේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කර නොමැත (පුඤ්ඤරතන හිමි 1964). ගුණවර්ධන තම සිවුර සහ නඟුල ග්‍රන්ථය රචනා කිරීමේදී සංඝයා සහ රජු යනුවෙන් පරිච්ඡේදයක් වෙන් කර තිබුණත් එහිදී අනුරාධපුර යුගයේ පළමුවැනි සේන රාජ්‍ය සමයේ සිටම සිය අවධානය යොමු කර තිබේ. ගුණවර්ධනගේ මෙම ග්‍රන්ථය ශාස්ත්‍රීය ලෝකයේ ඉතා වැදගත් ග්‍රන්ථයක් ලෙස සලකනු ලැබේ (ගුණවර්ධන 1993). මැන්දිස් රෝහණධීර විසින් රචිත නිශ්ශංකමල්ල කෘතිය තුළ පරිච්ඡේද පහක් වෙන් කරමින් කරුණු විග්‍රහ කර ඇති අතර නිශ්ශංකමල්ලගේ ආගමික කටයුතු සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබෙන්නේ ඉතා මඳ වශයෙනි. එනම් පිටු හයක් වැනි ප්‍රමාණයකිනි (රෝහණධීර 1998). පද්මනාදන් සිය කෘතිය වන Tamil Inscriptions in Sri Lanka Vol. I කෘතිය තුළින් දෙමළ ශිලාලේඛනවලින් හෙළිවන තොරතුරු ඉදිරිපත් කිරීමේදී හින්දු ආගමික තොරතුරුවලට සිය

අවධානය යොමු කරයි (Pathmanathan 2019). බෞද්ධාගමික පාර්ශ්වය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙන්නේ මඳ වශයෙනි. පොළොන්නරු යුගයේ භික්ෂු සංස්ථාව හා රාජත්වය අතර පැවති සම්බන්ධතාවලදී එහි ස්වරූපය කිනම් ස්වභාවයක් ගත්තේ දැයි සාමකාමී වූයේ දැයි ඝට්ටන ඇති වූයේ දැයි එසේත් නැත්නම් මිත්‍රශීලී ස්වරූපයකින් පවත්වා ගෙන ගියේ ද සහ දෙපිරිස අතර ක්‍රියාකාරිත්වය උච්චාවචනය වෙමින් පැවතියේ ද යන්න මෙම ග්‍රන්ථ කතුවරුන් විසින් සිය අවධානය යොමු කර නොමැත. අප විසින් කරනු ලබන විග්‍රහයෙහිදී මෙම කරුණු සම්බන්ධයෙන් දැඩි ලෙස අවධානය යොමු කරනු ලැබේ. එම කරුණු මෙම පර්යේෂණයේ අරමුණු ද වන අතර මෙම අරමුණු කෙතරම් දුරට සම්පූර්ණ වූයේ ද යන්න පිළිබඳව මූලාශ්‍රය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්වීතීයික මූලාශ්‍රය භාවිත කරමින් සංසන්දනාත්මකව විශ්ලේෂණයකට භාජනය කරමින් මෙම මාතෘකාව සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කරනු ලැබේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ පවතින ප්‍රාථමික සහ ද්වීතියික මූලාශ්‍රය මේ සඳහා පරිශීලනය කරන ලදි.

**සාකච්ඡාව**

මහින්දාගමනයෙන් පසුව ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද භික්ෂු ශාසනය කෙටි කලක් තුළ සංඛ්‍යාත්මක වශයෙන් වර්ධනය වෙමින් දිවයිනේ බොහෝ ප්‍රදේශවල පැතිර ගිය බව අභිලේඛන සාක්ෂි මගින් පැහැදිලි වේ. බුද්ධාගම ව්‍යාප්ත කිරීමෙහිලා හා බෞද්ධ ආචාර ධර්ම පද්ධතියට අනුකූලව සමාජය සකස් කරලීමේ කටයුතුවලදී භික්ෂුවගේ නායකත්වය මුල් අවධියේ සිටම වැදගත් විය. පෙළ දහමින් පිළිබිඹු වන සුවිශේෂ පරමාර්ථ හා ප්‍රතිපත්ති සහිත පරමාදර්ශී සමාජයක් වූ භික්ෂු සංස්ථාව මගින් ලක්දිව දේශපාලන ආර්ථික සමාජයීය හා සංස්කෘතික පාර්ශ්වයන් බෞද්ධ ආකල්පවලට අනුකූලව හැඩගස්වමින් සාමාන්‍ය ජන ජීවිතය හා බැඳුණු චර්යා පද්ධතිය සැකසීමට අවශ්‍ය පසුබිම සකසා අතීතයේ සිට වර්තමානය දක්වා ඉටු කොට ඇති කාර්යභාරය සුළු පටු නොවේ. භික්ෂුව හා පාලකයා වනාහි දෙයාකාරී අරමුණු

මත සංවිධානය වූ නැතහොත් ආධ්‍යාත්මික හා ලෞකික යන අංශයන්හි අරමුණු මත පවත්නා වූ ආයතන දෙකක ක්‍රියාකාරී නියමුවෝ වෙති. ප්‍රතිපත්තිමය වශයෙන් දෙමඟක ගමන් ගත්ත ද ක්‍රියාකාරිත්වයෙහිදී ඔවුනොවුන් අන්‍යෝන්‍ය බැඳීමකින් ක්‍රියා කළ බව පැහැදිලිය. එබැවින් පාලකයා හා භික්සුව අතර සම්බන්ධතාවයක් ඇති වීම පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආගමික ඉතිහාසයක් ගැන කථා කරන විට පැහැදිලිව ඉස්මතු වන කරුණකි. එමෙන්ම බුදුසමය ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසුව පාලකයින්ගෙන් තොර වූ ආගමික තත්ත්වයක් ගැනත් ආගමික ඉතිහාසයක් ගැනත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කථා කිරීමට ඇති අවකාශය සීමිතය. එමෙන්ම භික්ෂුව හා පාලකයා අතර ගොඩනැගුණු මෙම සම්බන්ධය යහපත් ප්‍රතිඵල ඇති වීම කෙරෙහි මෙන්ම අයහපත් ප්‍රතිඵල ඇති වීමට ද බලපා තිබෙන බව ඓතිහාසික මූලාශ්‍ර විමර්ශනය කරනවිට පෙනී යන කරුණකි. පොළොන්නරුව යුගයේ භික්ෂුව හා පාලකයා අතර සම්බන්ධතා ගොඩ නැගුණේ කිනම් ආකාරයකට ද යන්න විමසමින් එම සම්බන්ධතා කෙතෙක් දුරට පාලකයන්ගේ මෙන්ම දේශපාලන සංවිධානය වෙත බලපෑමක් කර තිබේද යන්න පිළිබඳවත් භික්ෂු ශාසනයේ පැවැත්මට පාලක දායකත්වය කෙතරම් වැදගත් වී ද යන්න ගැනත් විමසුමක් කිරීමට මෙම පර්යේෂණයෙන් බලාපොරොත්තු වේ. එබැවින් මෙම සම්බන්ධය ගැන කරුණු විමසීම සඳහා පාලකයන්ගෙන් භික්ෂුවට ලැබුණු අනුග්‍රහය කුමක් ද යන්නත් ශාසනික අනුග්‍රාහකයෙකු ලෙසින් පාලකයා ඉදිරිපත් වීමෙන් දේශපාලන වශයෙන් අත් වූ ප්‍රතිලාභ කවරේද යන්න ගැනත් සැලකිය යුතුවේ. එමෙන්ම භික්ෂුවගෙන් පාලකයා වෙත ලැබුණු අනුග්‍රහය කුමක් ද යන්නත් එම අනුග්‍රහය පොළොන්නරුව යුගයේ දේශපාලනයට කෙසේ බලපෑවේ ද යන්නත් විමසීම තුළින් රජු සහ භික්ෂුව අතරේ පැවති සම්බන්ධතාවයේ ස්වරූපය වටහා ගැනීමට හැකියාව ලැබේ.

පොළොන්නරුව ලංකාවේ අගනුවර බවට පත් වූයේ මෙරට චෝළ ආධිපත්‍යය පිහිටුවීමෙන් අනතුරුවය. මහාවංසයට අනුව ක්‍රි. ව. 992/93 දී චෝළයින් රජරට ප්‍රදේශය අත්කරගත්

නමුත් සිංහල රජු අල්වා ගෙන මෙරට සිංහලාධිපත්‍යය අහෝසි කරන ලද්දේ ක්‍රි. ව. 1017 දී බව පෙනේ. චෝළයින් දශක හතක් පමණ මෙරට පාලනය කිරීමෙන් පසුව ක්‍රි. ව. 1055 දී පළමුවැනි විජයබාහු රජතුමා යටතේ සිංහල පාලනාධිපත්‍යය නැවතත් ප්‍රතිෂ්ඨාපනය කළේය. චෝළ ආධිපත්‍යය පැවති යුගය තුළ මෙරට පැවති ආගමික තත්ත්වය පිළිබඳව මහාවංසය මෙසේ විස්තර කරයි. “ලංකාවේ ත්‍රෛනිකායටම අයත් වෙහෙර විහාර කොල්ලකා ඒවායේ තිබූ ඉතා වටිනා රන් රිදී පිළිම ආදිය ඔවුහු පැහැර ගත්හ. ලේ උරා බොන යක්ෂයින් මෙන් ලංකාවේ විවිධ පළාත්වල තිබූ වෙහෙර විහාර බිහිසුණු ලෙස විනාශ කරමින් ඒවායේ තිබූ වස්තුව කොල්ලකෑහ” (ඌනපූරණසහිතො මහාවංසො 1959: 55 පරි., 20-21). පසුකාලීන වංසකතා දෙකක් වන පූජාවලිය හා රාජාවලිය ද බුදුසමය වැනසීමට සොළීන් ගෙනගිය විනාශකාරී ක්‍රියාදාමය විස්තර කරයි. (පූජාවලිය 1930: 105; රාජාවලිය 1953: 42). චෝළයින්ගේ ක්‍රියාදාමය පිළිබඳව විස්තර කරන නීලකණ්ඨ ශාස්ත්‍රී මෙරට නතු කර ගැනීමට සටන් කිරීමේදී විනාශකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් වැළකී සිටීමට නොහැකි වූ බව පවසයි. (History of Ceylon, University of Ceylon Vol. I, Pt. II, 1960: 415-416) චෝළ හමුදාව හින්දු හමුදාවක් වූ නිසා ඇතැම් විට සිතාමතාම විනාශකාරී පිළිවෙතක් ගෙනයන්නට ඇත. කෙසේ හෝ චෝළ ආධිපත්‍යය පැවති යුගයේදී රට තුළ සාමය බිඳ වැටී රට ව්‍යාකූල තත්ත්වයකින් පැවති බව සමහර තොරතුරුවලින් පෙනී යයි. එබැවින් මෙරට ජන ජීවිතය අවුල් වියවුල් වී අසහනකාරී තත්ත්වයකින් පැවතිණැයි සිතිය හැකිය. පළමුවැනි විජයබාහු රජතුමා රාජශ්‍රීයට පත් වීමෙන් අනතුරුව බුදුහම හා භික්ෂු ශාසනය එවකට වැටී තිබූ ප්‍රපාතයෙන් ගොටගෙන යළි සමෘද්ධිමත් කිරීමට ප්‍රයත්න දැරීය. ඔහුගේ මෙම උදාර ප්‍රයත්නය තුන් කොටසකට බෙදා සාකච්ඡා කළ හැකිය. එනම් භික්ෂූන් වහන්සේලා නැවත පොළොන්නරුවේ වැඩ වාසය කරවීම උපසම්පදා කර්මය යළි පිහිටුවීම හා බුදුසමය හා භික්ෂු ශාසනය යළි පණ ගැන්වීම යනුවෙනි. ප්‍රථමයෙන්ම පොළොන්නරුව නගරය තුළ වෙහෙර විහාර ඉදි කරවා භික්ෂූන් වහන්සේලා ඒවායේ වැඩ වාසය කරවීය. චෝළයන්ගේ තාඩන

පීඩන හා කොල්ලකෑම් නිසාත් නොසැලකිල්ල හෝ බඳු නොගෙවා සිටීම හෝ හේතුකොට ගෙන විහාරාරාමවල ආදායාම් පහත වැටීම නිසාත් එසේම අපවත් වීම සහ අපවත් වූ භික්ෂූන් වෙනුවෙන් ඒ තත්ත්වයේ භික්ෂූන් අලුතෙන් ඇති නොවීම නිසාත් භික්ෂූන්ගේ සංඛ්‍යාව කොතරම් දුර අඩු වී ගියේ ද යත් උපසම්පදාව ආදි විනය කර්ම සඳහා වුවමනා ගණපූරක භික්ෂු සංඛ්‍යාව පවා නොවීය. එම නිසා රජතුමා සිල්වතුන් හා උගතුන් හැටියට පිළිගනු ලබන බුරුම තෙරවරුන් ලංකාවට එවන ලෙස බුරුම රජයෙන් ඉල්ලා සිටියේය. (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1972: 409) මෙහි පැමිණි භික්ෂූන් වහන්සේලා යළිත් උපසම්පදා කර්මය පැවැත්වූහ. මෙපරිද්දෙන් අලුත් භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් ඇති වූ හෙයින් උන්වහන්සේලා රටවැසියන්ගේ ආගමික ජීවිතයේ තමන්ට හිමි තැනට යළිත් පත්වීමට සංඛ්‍යාව හා උගත්කම අතින් සුදුස්සන් බවට පැමිණියහ. රජුගේ අණ පරිදි අලුත් රාජධානිය වටා අට්ටාල සහිත දැඩි පවුරක් දල ඒ වටා දිය අගලක් ද කරවන ලද්දේය. විජයබාහු රජුගේ මාළිගාව වනාහි අලුත් රාජධානිය තුළ මුලදීම කරවන ලද ගොඩනැගිලිවලින් එකක් බව අනුමාන කළ හැකිය. ඔහු මාළිගා භූමියට නුදුරුව උතුරු පැත්තෙන් දළදා මැඳුරක් කරවීය (එම., 409). රජතුමා විසින් පොළොන්නරුවේ කරවන ලදැයි සඳහන් විහාර අතර විශේෂයෙන් දක්වන ලද එක් විහාරයක් විසිතුරු බිහිදොරකින් යුක්ත විය. (ඌනපූරණසහිතො මහාවංසො 1959: lx; 11-13) මින්නේරි වැවට ජලය සැපයූ මහ ඇළ ඇතුළත් පෙදෙස වූ ආළිසාර රට මේ විහාරවල නඩත්තුව සඳහා පවරා දෙන ලද්දේය. බුදු සසුන නඟා සිටුවීමල ජරාවාසව තිබුණු විහාර අලුත් වැඩියා කරවීම, විහාරාරාමවලට ආදායම් පවරා දීම, භික්ෂූන් වහන්සේලාට සිවුපස පහසුව සලස්සාදීම සහ වෙනත් නොයෙකුත් පින් දහම් කිරීම රජුගේ වැඩ කටයුතු අතර ඉතා වැදගත් විය. ඔහු දූතයින් යවා මුතු මැණික් ආදි රත්නයන් දඹදිව ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට තමා නමින් පූජා කරවීය. රජු විසින් ප්‍රතිසංස්කරණය කරවන ලද වැදගත් විහාරවලින් කීපයක් නම් මහාගාමයේ ධාතු මන්දිර හා ථූපාරාම දෙකල අනුරාධපුරයෙහි මහාබෝධි විහාරය, නාගදීපයේ ජම්බුකෝළ විහාරය (මහාබෝධීන් වහන්සේ ගොඩබට

ස්ථානය), ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිරියායි අසළ ගිරිදණ්ඩක විහාරය, ජම්බුකෝළ ලෙන (දඹුල්ල), මණ්ඩලගිරි විහාරය (මැදිරිගිරිය), චන්දගිරි විහාරය (තිස්සමහාරාමයේ සඳගිරි), පණ්ඩවාපි විහාරය (හෙට්ටිපොළ අසළ පඬුවස් නුවර), දේවනගර විහාරය (දෙවුන්දර), මහියංගණ විහාරයල කාසගල්ල විහාරය (රන්න අසළ කහගල් වෙහෙර), වේලගාම විහාරය (ත්‍රිකුණාමලය අසළ වෙල්ගම් වෙහෙර හෙවත් නාතනාර් කෝවිල) හා උරුවේල විහාරයයි (මොනරාගලට ගිණිකොණින් පිහිටි ඇතිමෝලේ). (ඌනපූරණසහිතො මහාවංසො 1959: lx: 11-13). රජතුමාගේ දෙමාපියන් ආදාහනය කරන ලද ස්ථානය වූ බුදලවිට්ඨියෙහි විශාල සංඝාරාම පහක් කරවීම විශේෂයෙන් සැලකිය යුත්තකි. රජතුමා කොට්ඨසාර දිස්ත්‍රික්කයේ අන්තරවිට්ඨිය, සංඝාතගාමය, සිරිමණ්ඩල ගාමය (පොල්පිතිගම අසළ මහමඩගල) ගම්වර කීපයක් වනවාසි නිකායික භික්ෂූන් වහන්සේලාට පූජා කළේය. විහාර අභය චාරිත්‍රය බින්දා වූ මෙහෙසියට ඔහු දඬුවම් කළේ කෙසේද යත් මහා සංඝයා කෙරෙහි රජතුමා තුළ පැවති ගෞරවය එයින් ප්‍රකට වූයේ යැයි වංසකථාවේ සඳහන් වෙයි. ඇයගේ ආදායම් අත්හිටවන ලද්දේය. තවද ඇය යකඩ පටියක් බෙල්ලේ ලනු ලැබ නගරයෙන් පිටකරවන ලද්දීය. ඇය විසින් කරන ලද කවර නම් වරදක් සංඝයාගේ අමනාපයට හේතු වූයේදැයි සඳහන් කර නැත. තමන්ගේම බිසවට එතරම් දරුණු දඬුවමක් පැනවීමෙන් රජු විසින් ගන්නා ලද්දේ පෙර නොවූ විරූ අන්දමේ පියවරකි. ඇත්ත වශයෙන් එය ශ්‍රී ලංකාවේ ඉතිහාසයෙහි අනූපම වූ ක්‍රියාවක් බව රණවීර ගුණවර්ධනගේ අදහස වී තිබේ (ගුණවර්ධන 1993: 213). ඇය විසින් කරන ලද වරද හරියටම කුමක්දැයි යන්න ගැන තොරතුරක් සොයා ගත නොහැකිය. එහෙත් විහාරවල වරප්‍රසාද කඩ කිරීමේ ක්‍රියාවට ඇය වරදකාරියෙකැයි සලකන ලද බවට නම් සැකයක් නැත. පළමුවැනි විජයබාහුට මෙහෙසියෝ දෙදෙනෙක් සිටියහ. දෙදෙනාම විදේශිකයෝ වූහ. තිලෝකසුන්දරී කලිංග දේශික කාන්තාවක් වූ අතර සොළී රටේ කලක් වාසය කළ ලීලාවතී අයෝජ්ඣා දේශයේ කුමාරයෙකු වූ ජගතිපාලගේ දියණියකි. ඇතැම් විට ඔවුන් බෞද්ධයන් නොවන්නට ඇත. සංඝයාගේ වරප්‍රසාදවලට හානි කිරීමේ

වරදට රජ බිසව ප්‍රසිද්ධියේ නින්දා අපහාසවලට බඳුන් කිරීමෙන් සිත් කාවදින ලෙස ප්‍රදර්ශනය වූයේ සංඝයාගේ ආනුභාවය හා බලපෑමත් රජු ඔවුන්ගේ හොඳ හිත මත කෙතරම් රැඳී පැවතියේ ද යන්නත්ය. සමන්තකූටය නගිනු පිණිස අමාරු ගමනක යෙදුනු ගිහි පැවිදි වන්දනාකරුවන්ට ආහාරපාන සහ නවාතැන් සපයනු සඳහා ගිලීමලය (ගිලීමලේ) නමැති ගම පූජා කළ රජතුමා කදලිගාමය (කෙහෙල්ගමුව) හරහා වැටී තිබෙන මාර්ගයේත් හූව (ඌව) ප්‍රදේශයෙන් වැටී තිබෙන මාර්ගයේත් ගිමන් හල් පිහිටවීය. වංසකථාවේ සඳහන් මෙම කරුණු රජතුමාගේ තිස් අටවැනි රාජ්‍ය වර්ෂයට අයත් අඹගමුව සෙල්ලිපියෙන් තහවුරු වෙයි (Ceylon Journal of Science, Section G: 1930: 185). මේ පරිත්‍යාගය පිළිබඳ වැඩිපුර තොරතුරු එහි සඳහන් වෙයි. ශ්‍රීපාද කන්දට නැඟීමට මාර්ග තුනක් එකොළොස්වැනි සියවසේදී තිබුණේය. එනම් ගිලීමලේ හරහා වැටී තිබුණු සබරගමු මාර්ගය උලපනා (උලපනේ) වැලිගම්පොළ, අඹගමුව හා කෙහෙල්ගමුව හරහා වැටී තිබුණු රජරට මාර්ගය හා ඌවේ සිට වැටී තිබුණු මාර්ගයයි. රජතුමා රජරට සිට සමනොළ කන්දට වැටී තිබුණු මාර්ගයේ අන්තිම ගව් පහේ ගව්වකට එකක් බැගින් දන්සැල් කර වූ බවත් ශ්‍රීපාද ලාංඡනය දැලකින් වැසූ බවත් යතුරු සහිත දොරටු දෙකකින් යුත් මහ පවුරක් මුදුන් මළුව වටා කරවූ බවත් ශ්‍රීපාද ලාංඡනය දැක ගනු කැමති කුල හීනයන්ට සිටීමට පාත මළුවක් කරවූ බවත් ශ්‍රීපාදස්ථානයේ නඩත්තුව සඳහා ගම් කීපයක් නියම කොට ප්‍රදානය කළ බවත් මේ සෙල්ලිපියෙහි සඳහන් වේ. රජ පවුලේ අයත් ඇමතිවරුත් වෙනත් නිලධාරිවරුත් රජු අනුගමනය කරමින් විහාරාරාමාදිය ප්‍රතිසංස්කරණය කරවීමට හා තැනවීමටත් ඒවාට ඉඩකඩම් පූජා කිරීමටත් පටන් ගත්හ. වීරබාහු උපරජතුමා සොළීන් විසින් නසන ලද බද්ධගුණ විහාරයෙහි (ඌව පළාතේ ගිනිකොණ කෙළවරේ පිහිටි බුදුගුණ විහාරය) චෛත්‍ය ප්‍රතිසංස්කරණය කරවා එහි නඩත්තුව සඳහා ගම්වර පූජා කොට ඒ අසළ විශාල වැවක් ද කරවීය. රජතුමාගේ දියණිය වූ යශෝධරා කුමාරිය අනුරාධපුරයේ කප්පූරමූල විහාරයේ පිළිම ගෙයක් ද (Epigraphia Zeylanica, Vol. V 1955: 168). මහාගාමය අසළ සේලන්තරසමූහ විහාරයෙහි ප්‍රසාදයක් ද (ලංකා විශ්වවිද්‍යාලයේ

ලංකා ඉතිහාසය 1972: 409) කරවූවාය. මෙසේ බුදුසමය ජනප්‍රිය ආගමක් බවට පත් කිරීමට විජයබාහු රජතුමා කටයුතු කළ බව පෙනේ. කෙසේ හෝ ඔහුගේ පනස් අවුරුදු රාජ්‍ය කාලය තුළ බුදු සමය හා භික්ෂු සමාජය වැටී තිබුණු ප්‍රපාතයෙන් ගොඩ ගෙන නැවතත් පූජනීය තත්ත්වයට පත් කළේය. භික්ෂූන්ගේ තත්ත්වය කෙතරම් උසස් වී ද යත් විජයබාහුගේ මරණයෙන් පසුව රාජ්‍ය හිමි කුමරා සිහසුනට තේරීමේදී භික්ෂූන් වහන්සේලා ද ඊට සහභාගි වූ බව මහාවංසයෙන් පෙනේ. (ඌනපූරණසහිතො මහාවංසො 1959: lxi: 4) මේ අවස්ථාවේදී විජයබාහු රජුගේ පුතණුවන් වූ වික්‍රමබාහු කුමරාගේ රාජ්‍ය හිමිකම් ගැන නොසලකා එරජුගේ සොහොයුරාට සිහසුන පවරා සම්ප්‍රදාය විරෝධි ලෙස මානාභරණ කුමරුට උපරාජ පදවිය පැවරූ බව දැක්වේ. රාජ්‍යයේ කටයුතුවලට මෙබඳු අන්දමින් භික්ෂූන් වහන්සේලා සහභාගිවීම නිසා ඊළඟ දශක හතර තුළ සංඝාරාමවලට හා භික්ෂු සමාජයට ව්‍යසනකාරී තත්ත්වයක් උදාවිය. විජයබාහු රජුගෙන් පසුව ජයබාහු සිංහාසනයට පත් වුවද විජයබාහු රජුගේ පුත් වික්‍රමබාහුට ඔහු පරදවා සිහසුන අල්ලා ගැනීමට හැකි විය.

වික්‍රමබාහු රජ වීමෙන් අනතුරුව භික්ෂු සමාජයට අහිතකර යුගයක් උදා විය. වික්‍රමබාහු රජු භික්ෂූන්ට එරෙහිව කටයුතු කිරීමට පටන් ගත්තේය. මෙහි ප්‍රතිඵලයක් වූයේ ඔහු සංඝාරාම විනාශ කොට ඒවා හමුදා සෙබලුන්ට බාර කිරීමයි. පළමුවැනි පරාක්‍රමබාහු රජු රජවීමට පෙර පෙර සිටි රජවරුන් තිදෙනා හිංසාවෙන් සහ අධර්මයෙන් රට පාලනය කළහ. පිරිහුනු වස්තු ඇති ඔවුහු ධනය සොයන්නෝ වැඩි අයබදු උදුරා ගනිමින් උක් යන්ත්‍රයක උක් දඬු මෙන් සියලු වැසියන් පෙළූහ යනුවෙන් මහාවංසයේ සඳහන් වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 61: 51-53). විජයබාහු රජු විසින් ශාසනයට හා සංඝයාට කරන ලද හැම ශුභ සිද්ධියක්ම නැති කර දමන ලදි. සංඝයා කෙරෙහි වෛරී වීමට හේතුවක් ඇතිව සිටි වික්‍රමබාහු රජු භික්ෂූන් වහන්සේලා පොළොන්නරුවේ විහාරවලින් නෙරපා දමා ඒවායේ පිටරැටි කුලී හේවායින් වාසය කරවීය. හෙතෙම විහාර සන්තක ඉඩම් උදුරා ගෙන පක්ෂපාති ජනයාට දුන්නේය.

ධාතූන් වහන්සේලාට පූජා කර තිබුණු රන් මුතු මැණික් ආදිය ද රන්මුවා පිළිම ද වෙනත් මාහැඟි වස්තු ද පැහැර ගත් ඔහු ඒවා තම වැඩට යොදා ගත්තේය. අෂ්ටමූල විහාරවාසී පාංශුකූලික භික්ෂූන් වහන්සේලා දළදා වහන්සේ සහ පාත්‍ර ධාතූන් වහන්සේ රහසින් පොළොන්නරුවෙන් ගෙන ගොස් රෝහණයෙහි සඟවා තැබූහ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 61: 54-61). මේ නිසා පළමුවැනි විජයබාහු රජු විසින් පොළොන්නරුවට ගෙන්වා වාසය කර වූ භික්ෂූන් වහන්සේලා එම නගරය ඇත්හැර නැවතත් රෝහණ දේශයට පලා ගිය බව දැක්වේ. මෙහි ප්‍රතිඵලය වූයේ මහ විජයබාහු රජු විසින් ඇති කළ ආගමික ප්‍රබෝධය යළි අහෝසි වීමයි. එහෙත් මෙම කාල පරිච්ඡේදය භික්ෂූන් වහන්සේලාට එක් අතකින් වාසිදායක විය. විජයබාහු රජුගේ කාලයෙහිදී සංඝ සමාජය පුනර්ජීවනය වූයේ අනුරාධපුර යුගයේ පටන් පැවති නිකාය භේදය සමඟය. මහාවිහාරල අභයගිරි හා ජේතවන නමින් වූ නිකාය තුන එසේම පැවතිණි. විජයබාහු රජු භික්ෂු සමාජය යළි පන ගැන්වීමට අදහස් කළා මිස භික්ෂු සමාජයේ පැවති අසමඟිකම් නැති කිරීමට උත්සාහ නොදැරීය. මීට හේතුව වූයේ එබඳු ආගමික වාතාවරණයක් ගොඩනංවා ගැනීමට ඔහු අසමත් වීමයි. වික්‍රමබාහු රජුගේ කාලයෙහිදී ඇති වූ දැඩි ව්‍යසනකාරී තත්ත්වය භික්ෂු සමාජයේ උන්නතියට හිතකර වූ බව පෙනේ. එම තත්ත්වය නිසා භික්ෂූන් අතර පැවති නිකායික අසමඟිකම් තුනී වී ගියේය. පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ කාලයෙහිදී සංඝ සමාජය සමඟි කරවීමට මෙම තත්ත්වය බෙහෙවින් තුඩු දුන් බව පැහැදිලිය.

පළමුවැනි පරාක්‍රමබාහු රජු රාජ්‍ය කටයුතු තම අතට ගත් පසුව තමාගේ සියලුම ශක්තිය රටේ දියුණුව සඳහා යෙදවීය. ඔහු විසින් ශාසනයට කරන ලද සේවය ඉතා වැදගත්ය. බුද්ධ ශාසනය භේදවලින් තොර කිරීමට සිතූ රජු තුන් නිකායේ මහ තෙරවරුන් රැස් කොට සංගායනාවක් කරවීය. වෛතුල්‍ය ධර්මය සත්‍ය ධර්මයක් ලෙස පෙනී සිටීමට තවමත් තැත් කරතැයි යන හැඟීම නිසා මෙසේ කරන්නට සිදු විය. මෙම සංගායනාව මෙහෙයවීමට ශාස්ත්‍රධරයෙකු ලෙස මහත් කීර්තියක් සහ ශිලවන්තයෙකු ලෙස

මහා පිළිගැනීමක් ද ඇතිව වැඩ සිටි උදුම්බරගිරි විහාරවාසී මහා කස්සප තෙරුන් වහන්සේ ඔහු විසින් තෝරා ගන්නා ලදි. තවත් වරක් විරුද්ධවාදී නිකායිකයින්ට සහ මහා විහාරවාසීන්ට ද එක්සත් වන ලෙස ඔහු කියා සිටියේය. එහෙත් මහා විහාරවාසීහු ඊට විරුද්ධ වූහ. එක්ව අධිකරණ ශාලාවක පවා සිටීමට අකමැති වූ ඇතමෙක් විදේශයන් කරා ගිය අතර තවත් කෙනෙක් ශාසනයෙන් ඉවත් වූහ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 78: 13) තමා විසින් කරන ලද විජයග්‍රහණයන් තරම් මෙම කටයුත්ත පහසු නොවන බව රජුට වැටහිණි. ඊට අනතුරුව ධර්මරුචි, සාගලීය සහ වෛතුල්‍යවාදී සියලු භික්ෂූන් ලතා මණ්ඩපයෙහි රැස් කරවා රාත්‍රිය මුළුල්ලෙහි ත්‍රිපිටකය කියවා දුස්සීලයන් ශාසනයෙන් පහ කරවීය (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි 78: 17-28).

පොළොන්නරුවේ ගල්විහාර සෙල්ලිපියත් මහාවංසයත් පරාක්‍රමබාහු රජුගේ අභිලාෂය වූයේ සංඝයා සමඟි කරවීම හා භික්ෂු ශාසනය සංශෝධනය කිරීම බව පැහැදිලිවම පෙන්වා දෙයි. ඇතැම් විට සංඝ සාමග්‍රියට වඩා භික්ෂු ශාසනය සංශෝධනය කිරීම බෙහෙවින් දුෂ්කර කාර්යයක් වන්නට ඇත. සංඝ සංශෝධනයකදී දුසිල්වත් භික්ෂූන් තේරීම ඉතා සුපරීක්ෂාකාරීව කළ යුතු කාර්යයක් වන බැවිනි. එවකට විසූ භික්ෂූන් වහන්සේලා ධර්මය හා විනය නොපිළිපදිමින් තම තමන්ට රිසි පරිදි ජීවත් වූ බව මහාවංසය සඳහන් කරයි. ඇතැම් භික්ෂූන් වහන්සේලා ගිහි ජීවිතයට සමානවම අඹුදරුවන් රකිමින් සාංඝික දේපළ භුක්ති විඳිමින් ජීවත් වූ බවත් තම තමන්ගේ කුස පුරවා ගැනීමේ අභිලාෂයෙන් පමණක් මහණ දම් පිරූ විෂමාචාර භික්ෂූන් ද විසූ බව එහි දැක්වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි 69 .d 3-4, පරි. 73 ගා 5-6, පරි. 78 ගා. 2). එපමණක් නොව පරාක්‍රමබාහු රජතුමා සිහසුනට පත්වන අවධිය වන විට සිය ගණන් දුර්මතවාදී දහම් කොටස්වලින් සංඝ ශාසනය දූෂණය වී තිබූ බව ද වංසකථාව සඳහන් කරයි (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 13 ගා 5). ධම්මරුචි, සාගලික හා වෛතුල්‍යවාදී නිකායයන්ට අයත් දුසිල්වත් භික්ෂූන් මෙම ශාසන සංශෝධනයෙහිදී නෙරපා හැරිය බව නිකාය සංග්‍රහයේ දැක්වේ (නිකාය සංග්‍රහය 1955: 25).

මෙම දිවයින තුළ වාජිරියවාදය පැවති බවත් අඥාන බැතිමතුන් විසින් එය ඇදහූ බවත් තවදුරටත් දැක්වේ (නිකාය සංග්‍රහය 1955ඃ වී අමරමෝලි හිමි 21). පොළොන්නරුව යුගයේ විසූ සුමංගල නම් තෙර නමක් විසින් ලියන ලද අභිධම්මත්ථ විකාසිනියෙහි අභයගිරිවාසී භික්ෂූන් වහන්සේලාගේ ඉගැන්වීම් මහා සාංඝික භික්ෂූන් වහන්සේලාගේ අදහස්වලට සමාන යැයි දක්වා තිබේ (අභිධම්මත්ථ විකාසිනී 1961ඃ 46, 128-129; 136, 169, 352, 364-365; 387). බුදුන් වහන්සේගේ ධර්ම කොටස් අර්ථ කථනය කිරීමේදී මහාවිහාරය හා අභයගිරිය අතර වෙනස්කම් පැවති බව මේ අනුව පැහැදිලි වේ. ආත්ම ලාභය තකා භික්ෂු ශාසනය විනාශ කරන සිය ගණන් දුසිල්වත් භික්ෂූන් පරාක්‍රමබාහු රජු විසින් උපැවිදි කරවා ගිහිජීවිතය සාර්ථක කර ගැනීමට හැකිවන පරිදි සුදුසු රැකියා දුන් බව සඳහන් වේ (Gunawardana 1979:321). කරුණු මෙසේ වුවත් බෙහෙවින් උගත් සිල්වත් භික්ෂූන් වහන්සේලා මෙකල විසූ බවට ද සාධක ඇත. පරාක්‍රමබාහු රජතුමා එවැනි භික්ෂූන් තෝරා බේරාගෙන මේ සංඝ සාමග්‍රියට හා සංඝ සංශෝධනයට සහභාගි කරවා ගත්තේය. උදුම්බර ගිරි විහාරවාසී දිඹුලාගල කාශ්‍යප ස්වාමීන් වහන්සේ එවැනි හිමි නමක් බව පෙනේ. වනවාසී නිකායට අයත් වූ උන් වහන්සේ එදා විසූ භික්ෂූන් වහන්සේලා අතුරින් විශේෂයෙන්ම විනය පිළිබඳ හසල දැනීමෙන් යුක්ත වූ ත්‍රිපිටකධාරී භික්ෂු නමක් බව මහාවංසයේ සඳහන් වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959ඃ පරි. 78ඃ 8). උන්වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ සාරිපුත්ත තෙරණුවන් විසින් කාශ්‍යප හිමි හඳුන්වා ඇත්තේ විනය පිළිබඳ විශේෂඥයෙකු වූ සංඝ පීතෘවරයාණන් වහන්සේ කෙනෙකු ලෙසය (සාරත්ථදීපනී 1933ඃ 1). ගල්විහාර ශිලාලිපියට අනුව සංඝ සංශෝධනය සඳහා පවත්වන ලද සංඝ සභාවේ ප්‍රධානත්වය ඉසිලීමට තෝරා ගන්නා ලද්දේ උදුම්බර ගිරියෙහි මහා කාශ්‍යප තෙරුන් වහන්සේය (Epigraphia Zeylanica, Vol. II, 1929: 268-269). මේ හැර දිවයිනේ සියලුම නායක තෙරුන් වහන්සේලා මේ සංඝ සභාවට රජු විසින් කැඳවන ලදි. අනුරාධපුරයේ විසූ ඥානපාල තෙරුන් හා උන් වහන්සේගේ ශිෂ්‍ය පිරිසත්, සපර දේශයෙහි විසූ මොග්ගල්ලාන තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාත්,

නාගන්දිපල්ලි තෙරුන් වහන්සේත්, යුව රජුගේ ප්‍රදේශයට අයත් සියලුම භික්ෂූන් වහන්සේලාත්, රෝහණ දේශයෙහි ත්‍රෛනිකායික භික්ෂූන් වහන්සේලාත් මේ සංඝ සභාවට කැඳවන ලදි. මේ අයුරින් නිකායික භේදයෙන් තොරව සියලුම භික්ෂූන් වහන්සේලා මෙම සංඝ සභාවට සහභාගි කරවා ගැනීම රජුගේ අභිමතාර්ථය වූ බව පෙනේ. එහෙත් මහාවංසයෙහි සඳහන් කොට ඇති ලේඛනයෙන් දිවයිනේ සියලුම සංඝායතනවලින් භික්ෂූන් සහභාගි කරවා ගත් බවක් නොපෙනේ. විජයබාහු රජුගේ රාජ්‍ය කාලයෙහිදී නිකාය තුනට අමතරව මූලායතන අටක් පැවති බව වංසකථාවල සඳහන් වේ. වික්‍රමබාහු රජුගේ කාලයෙහිදී විවිධ සංඝාරාමවලට අතවර කළ නමුත් පරාක්‍රමබාහු රජුගේ කාලයෙහිදී ඒවා යළි ප්‍රකෘතිමත් කරන්නට ඇතැයි සිතිය හැකිය. එසේම අෂ්ට මූලායතන ද යළි පන ගන්වන්නට ඇත. එහෙත් මෙම ආයතනවල තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති සාධක විරලය. කෙසේ වෙතත් මේ සංඝ සභාවට කැඳ වන්නට ඇත්තේ රජු විසින් පිළිගන්නා ලද ප්‍රකට භික්ෂූන් වහන්සේලා පමණක් බව සිතිය හැකිය.

මෙම ශාසන සංශෝධනය පිළිබඳ සැල වූ වහාම ඇතැම් භික්ෂූන් ඊට දැක් වූ ප්‍රතිචාරයෙන් එම සංශෝධනයෙහි පැවති බැරෑරුම්කම වටහා ගත හැකිය. සමහර භික්ෂූන් වහන්සේලා සංඝ සංශෝධනයට මුහුණ දීමට නොහැකිව රට අතහැර ගිය බව මහාවංසයේ දැක්වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 78 ගා 13). පරාක්‍රමබාහු රජුගේ මෙම ප්‍රයත්නයේ පරමාර්ථය වූයේ සංඝ ශාසනය දූෂණය කරමින් එය අපවාදයට ලක් කරන දුසිල්වත් ධම්මරුචි, සාගලික හා වෛතුල්‍යවාදී නිකායන්ට අයත් භික්ෂූන් නෙරපා හැරීම යැයි නිකාය සංග්‍රහය පවසයි. බුද්ධ භාෂිතය නොවන වෛතුල්‍ය පිටකය වැනි දහම් කොටස් බුද්ධ භාෂිත යැයි කියමින් දේශනා කළ අභයගිරි හා ජේතවන නිකායවාසීන් මහාවිහාර වාසීන් සමඟ සමගි කිරීම අතිශයින් දුෂ්කර කරුණක් වන්නට ඇත. ගුණවර්ධන පෙන්වා දෙන අන්දමට නිකාය සංග්‍රහයේ දැක්වෙන ඉහත කී කරුණ සම්පූර්ණයෙන්ම නිවැරදි විය නොහැකිය. ඊට හේතුව නිකාය සංශෝධනය සියලුම නිකායන්ට සාධාරණ වූ නිසාය (Gunawardana 1979:

319). එසේම මහා කාශ්‍යප තෙරුන් වහන්සේ මහා විහාරයට පක්ෂපාතී භික්ෂුවක් වුවත් මේ සංඝ සභාවේ ප්‍රධානත්වය දැරීමේදී සිය කාර්යයන් පක්ෂපාතීව කළ බවට සාක්ෂි නොමැත. කෙසේ වෙතත් පරාක්‍රමබාහු රජු විසින් ක්‍රියාත්මක කරන ලද සංඝ සාමග්‍රිය හා සංඝ සංශෝධනය ප්‍රතිඵල රහිත වූවා යැයි කිව නොහැකිය. මෙතෙක් පැවති නිකාය භේදය පිළිබඳ හැඟීම තුනී වී ගිය ද විජයබාහු රජුගේ කාලයේ පටන් පැවති අෂ්ට මූලායතන නමින් වූ සංඝායතන අට එකිනෙකට වෙනස් ආගමික මතවාද සහිතව වර්ධය විය. විජයබාහු රජතුමාගේ ඇවෑමෙන් සිහසුනට හිමිකරු තීරණය කිරීමේ රාජ සභාවේදී අෂ්ටායතන භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛත්වයක් දැරූ බව මහාවංසයේ දැක්වෙන විස්තරයෙන් පැහැදිලි වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 61:1-4). උත්තරෝමූල, දක්ඛිණමූල, කප්පූරමූල, මහනෙත්පාසාදමූල, වහදීපකමූල, සේනාපතිමූල, උපලන්තරමූ, හෙවත් සේලන්තරමූල, විල්ගම්මුල හෙවත් සරෝගාමමූල යනුවෙන් ඒ ආයතන අට හැඳින්විණ. පරාක්‍රමබාහු රජුගේ කාලයෙහිදී මේ ආයතන අටේ භික්ෂූන් වහන්සේලා සඳහා තුන්මහල් ප්‍රාසාද අටක් තැන වූ බව මහාවංසයේ දැක්වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 61: 1-4). මේ පිළිබඳ විස්තරාත්මක වර්ණනයක් පූජාවලියේ සඳහන් වී තිබේ (පූජාවලිය 1930: 105 බී සද්ධාතිස්ස හිමි). මේ තොරතුරුවලට අනුව පැහැදිලි වන්නේ මෙම මූලායතන අට පොළොන්නරුව යුගයේදී බලවත්ව පැවති බවය. පළමුවැනි පරාක්‍රමබාහු රජු ආයතන අටේ නියෝජිතයන්ට පොළොන්නරුවේ ජේතවන විහාරයේ නවාතැන් සැලසූ බව මහාවංසයේ වාර්තා වී ඇත (ඌනපූරණසහිතො මහාවංසො 1959: 78: 32-34). විහාරවලට මුලින් අයත්ව තිබූ දේපළ ආපසු නොදුන්නත් මේ විහාරයටත් තමන් විසින් පොළොන්නරුවෙහි ඉදි කරන ලද අනිත් විහාරස්ථාන හතටත් යටත් පිරිසෙයින් ආදායම් ලැබෙන මාර්ගයක් සැලසීමට රජුට සිදු වන්නට ඇත. එබඳු පැවරීමක් ගැන වංසකථාවෙහි සඳහන් වී නැති නමුත් පූජාවලිය කියන අන්දමට ඔහු මේ භික්ෂූන්ට 'පොළොන්නරු වරුපෙතින් වටනාපස' පිදුවේය (පූජාවලිය 1930: 106). මෙහිදී පස යන වචනය පිළිබඳව ගුණවර්ධන විසින් අදහස් දක්වා තිබේ

(ගුණවර්ධන 1993: 95). ඔහුගේ අදහසට අනුව පොළොන්නරුවේ කුඹුරුවලින් වටිනා කොටස් යනුවෙන් හෝ පොළොන්නරුවේ කුඹුරුවල ආදායමේ ආධාරයෙන් වටිනා අවශ්‍යතා යනුවෙන් හෝ එය තේරුම් කළ හැකිය. තවද ගල්පාත විහාර අභිලේඛනය පළමුවැනි පරාක්‍රමබාහු සමයට අයත් නම් සියඹලාපයාල තිංගවටුල තිරතනයාවත්තල ධර්මනන්ද හා මානදූව දූපත්ල බොලුතුඩාව සහ බෙරවාගොඩ යනාදී ස්ථානවල කුඹුරු දල පොල් හා පුවක් වගාව ද ගල්පාත විහාරයට ප්‍රදානය කළ බැව් පෙනේ. එහෙත් මේ ලේඛනය ඊට බෙහෙවින් මෑත කාලයකට අයත් යැයි ද සිතිය හැකිය. එමෙන්ම තමන්ට කලින් රජවරුන් විසින් රාජ සන්තක කරන ලද විහාර දේපළ පළමුවැනි පරාක්‍රමබාහු විසින් ඇත්ත වශයෙන්ම විහාරවලට ආපසු දෙන ලද්දේ නම් මහාවංස කර්තෘ තම කථාවේ ප්‍රධාන චරිතය සැබවින්ම වීරෝදාර ස්වරූපයකින් ඉදිරිපත් කිරීමට හිතාමතාම කර ඇති ප්‍රයත්නයේදී මේ ක්‍රියාව සවිස්තරව වර්ණනා කිරීමේ අවස්ථාව පැහැර හරිනු ඇතැයි සිතීම අසීරුය. පළමුවැනි පරාක්‍රමබාහුගේ ප්‍රතිසංස්කරණ කටයුතු ද ඔහුගේ අනුග්‍රහය යටතේ සංඝ සමාජයේ ඇති වූ පුනර්ජීවය ද කරණකොට ගෙන ඵලදායක පණ්ඩිත ගෝචර වැඩකටයුතුවලින් ගහණ යුගයක් උදාවිය. සංඝ ප්‍රතිසංස්කරණයෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ උදුම්බරගිරියේ කස්සප ත්‍රිපිටකයෙහිම කෙළ පැමිණි විශේෂයෙන්ම විනය පිටකය ගැන විශාරද දැනුමකින් යුතු වූ පඬිවරයෙකු ලෙස හඳුන්වනු ලැබ ඇත. ඔහුගේ ශිෂ්‍ය සාරිපුත්ත ඔහු හඳුන්වා ඇත්තේ සංඝ සමාජයේ පියා ලෙසය (ඌනපූරණසහිතො මහාවංසො 1959: 78: 7). එමෙන්ම විනය පිළිබඳ විශේෂඥයෙකු ලෙසය. විනය තත්ත්වයන් යළි නඟා සිටුවීම හදිසි සහ අත්‍යවශ්‍ය කාර්යයක් වූ මේ වකවානුවේදී ඔහු පරමාදර්ශී නායකයෙක් වූ බව ගුණවර්ධන සඳහන් කරයි (ගුණවර්ධන 1993:159). මෙම සමය වැදගත් පඬිවරුන් ගණනාවක් විසින් කෘතීන් ගණනාවක් රචනා කර තිබේ. පොළොන්නරුව යුගයේ සාහිත්‍ය කෘතීන් බොහොමයක ම පළමුවැනි පරාක්‍රමබාහු විසින් පිරිනමන ලද නොමසුරු අනුග්‍රහය ගැන කෘතඥ පූර්වකව සඳහන් කර තිබේ. එම කෘතීන් සමහරක් කරන ලද්දේ ඔහුගේ ඉල්ලීම උඩය (ගුණවර්ධන 1993: 166). පළමුවැනි පරාක්‍රමබාහුගේ

රාජ සමය විස්තර කරන මහාවංසය සොළීන් විසින් විනාශ කරනු ලැබ තිබූ රත්නවාලුක, අභයගිරිය, ජේතවන හා මිරිසවැටි ස්තූපයන් ද ලෝහප්‍රාසාදය ද රජු විසින් අලුත් වැඩියා කරන ලද බැව් කියා තිබේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 78: 96-104). මෙහි පළමු කී ස්තූප තුන සම්බන්ධයෙන් එම ප්‍රකාශයම කරන පූජාවලිය මෙම නාමලේඛනයට ථූපාරාමය එකතු කර ඇත. එම නාම ලේඛනයට ඇතුළත් කර නැතත් ලෝහපාසාදය නමැති ස්ථානයත් මේ රජුගේ සමයෙහි දී අලුත්වැඩියා කරන ලදැයි එහි සඳහන් වී ඇත (පූජාවලිය 1930: 166). එසේ වුවද රජරට ප්‍රදේශය සොළීන්ගෙන් ආපසු දිනා ගැනීමෙන් පසුව හතළිස් අවුරුද්දක් රජ කළ එමෙන්ම පොළොන්නරුවේ අලුත් විහාරස්ථාන ගණනාවක් ඉදි කළ තවද ඇත පළාත්වල ආගමික ආයතන කීපයක් ප්‍රතිසංස්කරණය කළ පළමුවැනි විජයබාහු බෞද්ධයින්ට අතිශයින්ම පූජනීය වූ මෙම සිද්ධස්ථාන අලුත්වැඩියා කිරීමට කිසි ප්‍රයත්නයක් නොදැරුවේ යැයි විශ්වාස කිරීම තරමක් අසීරුය. මෙය පැහැදිලි කිරීමට මහාවංසය වෑයම් කොට ඇත්තේ කලින් රජවරුන් විසින් ඒවා ප්‍රතිසංස්කරණය නොකළේ එය එතරම් දුෂ්කර කාර්යයක් වූ බැවිනැයි කීමෙනි (ඌනපූරණසහිතො මහාවංසො 1959: 78: 96-97). වංසකථාවලින් සැපයෙන සාක්ෂි කෙබඳු වුවත් මේ සිද්ධස්ථාන සමහරක් ජරාවාස වීමට හේතු වූයේ සොළී භටයින් විසින් වුවමනාවෙන්ම කරන ලද විනාශයම නොව පළමුවැනි පරාක්‍රමබාහු රජ වීමට පත් වීමට කලින් වූ වියවුල් සහගත සමයේ පැවති නොසැලකිල්ල යැයි සිතීමට ද ඉඩ තිබේ. එබැවින් පළමුවැනි පරාක්‍රමබාහු විසින් ඉටු කරන ලද සිද්ධස්ථාන හා විහාර ප්‍රතිසංස්කරණය කිරීමේ කාර්යයෙන් පිළිබිඹු වන්නේ බුද්ධාගම වදහිංසාවලට බඳුන් කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ සටන්කාමී සොළීන් විසින් කරන ලද විනාශයේ විශාලත්වයම යැයි තර්ක කිරීම නුවණට හුරු නොවේ.

තනි නායකයෙකු යටතේ එක්සත් සංඝ සභාවක් බිහි කරනු ලැබීම කරණ කොට ගෙන ලාංකීය සමාජයේ බල ව්‍යූහයෙහි වැදගත් වෙනස් වීම් සිදුවනු ඇතැයි බලාපොරොත්තු විය හැකිව තිබූ බව ගුණවර්ධන සඳහන් කරයි (ගුණවර්ධන, 1993:

342). එහෙත් ඇත්ත වශයෙන් ඇති වූයේ ඊට වෙනස් තත්ත්වයකි. භික්ෂූන්ට කෙලින්ම දේශපාලන අධිකාරි බලය පාවිච්චි කිරීමට විනය නීති අනුව අවසර නොතිබිණ. ඒ නිසා ඔවුහු රජුගේ බලයට තර්ජනයක් නොවූහ. තවද සංඝයා එක්සත් කරනු ලැබූ නමුත් සමහර කරුණු අතින් භික්ෂූන්ට තිබුණේ නවවැනි හා දහවැනි සියවස්වලදී ඔවුන්ට තිබුණාට වඩා අඩු බලයකි. විහාර දේපළ හා වරප්‍රසාද නැති වීමත් විහාරස්ථ පරිපාලනය බිඳවැටීමත් කරණ කොට ගෙන සංඝයා සතුව තිබූ ඉතාම වැදගත් බල මූලයන් සමහරක් ඔවුන්ට අහිමි විය. සංඝයා ප්‍රතිශෝධනය හා ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතුවලට රජු සහභාගි වීම මඟින් පැවිදි කටයුතු සම්බන්ධයෙන් ද සංඝ ධූරාවලියේ වඩා වැදගත් පදවිවලට භික්ෂූන් පත් කිරීමේදී ද ඔහුට බලපෑමක් ලැබිණ. මූල අටේ සංඝ නායකවරුන් හා ප්‍රධාන විහාරවල අධිපතීන් පත් කිරීමේදී රජුගේ අනුමැතිය ඇති භික්ෂූන් තෝරා ගත යුතු බැව් දඹදෙණි කතිකාවත මඟින් නියම කර තිබිණ. පැවිදි සංවිධානය තුළ වඩා ඉහළ තනතුරු චාරිත්‍රානුකූලව ප්‍රදානය කරන ලද්දේ රජු විසිනි. ගිහි පැවිදි දෙපක්ෂයේ බලවතුන් අතර සුහද සබඳතා ගොඩනැඟීම මෙන්ම රජුගේ අධිකාරයට අභියෝග කිරීමට සමත් බලවේගයක් බවට සංඝයා යළි සංවර්ධනය වීම වැළැක්වීම සම්බන්ධයෙන් ද එම වැඩ පිළිවෙල ප්‍රතිඵලදායි වන්නට ඇතැයි යන්න ගුණවර්ධනගේ ගැඹුරු අදහසයි (ගුණවර්ධන, 1993ඃ 342).

බුද්ධාගමේ ඉතිහාසයෙහි ලා ඉතා වැදගත් වන මේ සිද්ධිය සිදු වූයේ වට්ටගාමණී අබය රාජ්‍ය කාලයෙහිදී පළමු වරට නිකාය භේදය ඇති වූ තැන් සිට එක්වා දහස් දෙසීය සූපණස් අවුරුද්දක් ගිය කල්හි බව සමකාලීන ගල් විහාර ලිපියේ සඳහන් කර තිබේ (Epigraphi Zeylanica, Vol. II, 1929: 273). ප්‍රථම සංඝ භේදය සිදු වූ කාලය හැටියට නිකාය සංග්‍රහයේ සඳහන් කර තිබෙන චිරන්තන වර්ෂය බුද්ධ වර්ෂ 454 වැන්නය. එහෙයින් සංඝයා සමඟි වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් 1708 අවුරුද්දක් ගත වූ පසුය (නිකාය සංග්‍රහය 1955ඃ 21). පරාක්‍රමබාහු රජු සිංහාසනාරූඪ වූයේ බුද්ධ වර්ෂ 1696 වැන්නේදීය. සංඝයා සමඟි වූයේ රජුගේ දොළොස් වැනි රාජ්‍ය වර්ෂයේදීය (ක්‍රි. ව. 1165). මෙම රජු

බුරුමය ආක්‍රමණය කිරීමට සේනාවක් යැවූයේ මේ අවුරුද්දේදී හෝ ඊට පෙර අවුරුද්දේදීය (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1972:540). බුරුමයේ සහ ලංකාවේ රජුන් දෙදෙනා භේද වූ පසු රටවල් දෙකේ භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් වී සාමය ඇති කරනු ලැබූ බව කියා තිබේ. භික්ෂූන් වහන්සේලාගේ විනය ප්‍රතිපත්ති දියුණු වීමට හේතු වූ මේ ශාසන ශෝධනය නිසා ලංකාවේ බෞද්ධ සිද්ධස්ථාන කෙරෙහි මහත් භක්තියක් ඇතිව සිටි බුරුම බෞද්ධයෝ ලංකාවේ භික්ෂූන් වහන්සේලාට තවතවත් ගෞරවාදර දක්වන්නට පටන් ගත්හ. නරපු රජු කුටෝපක්‍රමවලින් රජකම ලබා ගැනීම ගැන කලකිරී පව්වුන් ඇසුරු කිරීමට වඩා රටින් පිටව සිටීම ප්‍රිය කළ පන්ථගු නමැති බුරුම සංඝනායක මහා ස්ථවිරයන් වහන්සේ 1117 වැන්නේදී පැමිණියේ ලංකාවටය. බුරුම සංඝනායක කෙනෙකු වූ උත්තරාජීව නමැති රාජගුරු මහා ස්ථවිරයන් වහන්සේ තවත් ස්ථවිර බොහෝ දෙනෙකුත් ඡප්පට නමැති විසි හැවිරිදි සාමණේර නමකුත් මීට අවුරුදු තුන හතරකට පසුව ලංකාවට වැඩම කළහ. උන්වහන්සේලා මහත් හරසරින් පිළිගනු ලැබූහ. තවද ලංකා බුරුම දෙරටේ භික්ෂු සංඝයාගේ එකමුතුකම ක්‍රියාවෙන් පෙන්වනු රිසි වූ සිංහල මහා ස්ථවිරවරු බුරුම මහා ස්ථවිරවරුන් සමඟ එක සීමාවක හිඳ ඡප්පට සාමණේරයන් උපසම්පදා කරවූහ. උත්තරාජීව මහ තෙරණුවන් නොබෝ කලකින් බුරුමයට පෙරළා වැඩම කළ නමුත් ඡප්පට හිමියෝ අවුරුදු දහයක් මෙහි නැවතී ත්‍රිපිටකය හදාළහ. ඉක්බිති උන්වහන්සේ ලංකාවේදී උපසම්පදාව ලැබූ භික්ෂූන් තුන් නමකුත් සිංහල ස්ථවිර කෙනෙකුත් යන සතර නම සමග බුරුමයට පෙරළා වැඩම කළහ. ඡප්පට හිමියන් ඇතුළු පිරිස විසින් සීහළ සංඝ නමින් වෙනම නිකායක් පිහිටුවන ලදි. මේ නිකායට ඒ රටේ ආගමික ඉතිහාසයෙහි වැදගත් තැනක් හිමිවෙයි (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1972: 540). අන්තර්ජාතික වශයෙන් වැදගත් වන මෙම ආගමික සම්බන්ධතා ඇති වූයේ පළමු වැනි පරාක්‍රමබාහු රජුගේ ආගමික කටයුතු නිසා බව සඳහන් කළ හැකිය.

නොයෙක් නිකායයන් මෙසේ එක්සත් කිරීමෙන් පසු සැදැහැතියන් උදෙසා ගොඩනැඟිලි රාශියක් ද රජු විසින් තනවන

ලදි. නගරය ඇතුළත උතුරු වාහල්කඩ අසළ ඇති ගොඩනැගිලි කීපය ලෙස ගයිගර් මහතා විසින් හඳුනා ගනු ලැබූ ජේතවන විහාරය පරාක්‍රමබාහු විසින් කරවන ලදි. තිවංක පිළිම ගෙය, දන්ත ධාතූන් වහන්සේ සඳහා වූ මනහර වටදා ගෙය, ආලාහන පිරිවෙන, ලංකාතිලකය, උත්තරාරාමය හා තෙමහල් ප්‍රාසාද අටක් ඔහු කරවීය. පරාක්‍රමබාහු රජු විසින් තනවන ලද ආගමික ගොඩනැගිලිවල විශාල ලේඛනයක් මහාවංස කතුවරයා විසින් සඳහන් කර තිබේ. මේ ගොඩනැගිලි එකින් එක නම් කිරීමෙන් පමණක් වුවද ඒවා ඉදි කිරීමට අවශ්‍ය වුණු රටේ සෞභාග්‍යය ගැන සිතා ගත හැකි වෙයි. පළමුවැනි පරාක්‍රමබාහුගේ ශක්තිය ආගමික ගොඩනැගිලි ඉදි කිරීමෙහිලා පමණක් නොව සාහිත්‍ය දියුණු කිරීමෙහි ද යෙදවීය. මලලසේකර පරසතුරු වියවුලින් තොරව ඇතිවුණු අභ්‍යන්තරික සාමය හා සෞභාග්‍ය හේතු කොට රජු විසින් දරණ ලද මහත් වූත් අවංක වූත් උත්සාහයන් නිසා මෙම යුගය ලංකාවේ සාහිත්‍ය පිළිබඳ ස්වර්ණමය යුගය බවට පත් කළ උගතුන් රාශියක් බිහි වූ බව පවසන්නේ ඒ නිසාය (Malalasekera 1958: 178).

බුද්ධාගමේ උන්නතියට ක්‍රියා කළ පාලකයින් අතරින් මෙම යුගයේ පහළ වූ අවසාන වැදගත් පාලකයා වූයේ නිශ්ශංකමල්ල රජතුමායි (1187-1196). මොහු බෞද්ධ භික්ෂූන්ට සහ හින්දු පූජකවරුන්ට වස්තු සම්පත් ප්‍රදානය කිරීමෙන් සංග්‍රහ කළ පාලකයින් අතරින් විශේෂයෙන් කැපී පෙනෙන්නෙකි. බෞද්ධ සිද්ධස්ථානවල වෙහෙර විහාර ඉදි කළ කාලිංග වංශික රජවරුන් අතර නිශ්ශංකමල්ල රජතුමාට ප්‍රමුඛස්ථානයක් හිමි වෙයි. මොහු කර වූ ආගමික ගොඩනැගිලි අතර පොළොන්නරුවේ විශාලතම දාගැබ්වලින් එකක් වූ රන්කොත් දාගැබල උපකාර චෛතිය (Epigraphia Zeylanica, Vol. II, 1929: 273) හැටදාගේ සහ වටදා ගේ සඳහන් කළ හැකිය (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1972: 490). එසේම දඹුලු ලෙන රන් ආලේප කරවා අලංකාර කිරීම ද වැදගත් ආගමික කර්තව්‍යයකි (Epigraphia Zeylanica, Vol. II, 1929: 106, 111, 112). දෙවිනුවර, කැලණිය, දඹුල්ල, අනුරාධපුරය සහ සමනොළ කන්ද මෙම රජතුමා චාරිකාවෙහි යෙදුණු ප්‍රසිද්ධ

ආගමික ස්ථාන කීපයකි (Epigraphia Zeylanica, Vol. II, 1929: 141, 146; Vol. III, 1933: 331; ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1972: 489). නිශ්ශංකමල්ල කාලිංගයෙන් ආවකු වුව ද පැහැදිලිවම බෞද්ධ රජෙකු වූ බවට කරුණු තිබේ. බුදු සසුන් අයිති ලක්දිව අබෞද්ධ චෝළ පාණ්ඩ්‍යාදීන් නොපිහිටවිය යුතු යැයි ඔහු කියන්නේ තමා බෞද්ධයෙකු නිසා විය යුතුය (Epigraphia Zeylanica, Vol. II, 1929: 106). ඔහුගේ ආගමික ශ්‍රද්ධාව රුවන්මැලි පූජෝත්සව විස්තරයෙන් මොනවට හෙළි වේ. ඔහු දාගැබ් වහන්සේ පෙනෙන මානයේදීම වාහනයෙන් බැස ශ්‍රී පාදයෙන් රුවන්වැලි මළුවට වැඩ තිබේ. අනතුරුව ඔහු විවිධ පූජා පවත්වා තිබේ. (Epigraphia Zeylanica, Vol. II, 1929: 106). සිව්රඟ සෙනඟ පිරිවරා සමනොළ වැඩ ශ්‍රී පාදය වැඳි බව වංසකථා ද (ඌනපූරණසහිතො මහාවංසො 1959: 78:24; පූජාවලිය 1930: 784) විශේෂයෙන් භගවා ලෙන් ලිපිය ද (Ceylon Journal of Science, Section G, Vol. I, Pt. II, 1930: 19-21) අන් ලිපි විශාල ගණනක් ද කරන සඳහන්වලින් සනාථ වේ. නිශ්ශංකලතා මණ්ඩපයේ සිට දළදා වැඳ තිබේ. (JCBRAS, X, p. 68) දළදා පාදා වහන්සේට උරෙහි දා පුත් යුවරජව සිටි වීරබාහුන් වහන්සේ හා දූ සර්වාංග සුන්දරීන් වහන්සේ පුදා දෙදෙනා වහන්සේ ගළවා ගනු සඳහා ගන රන් දා ගැබක් කරවා තිබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 84; Ancient Inscriptions of Ceylon: 1833: 94). රන්තිසෑ මිණිහොරු ගඟතලා පදී ඇතුලු වූ තුන් රජයෙහි මහ වැ තැන අශේෂ ප්‍රාණීන්ට අභය දී නොමරන නියායෙන් සම්මත කරවූ බව ලිපි කීපයකම සඳහන් කරයි (Ancient Inscriptions of Ceylon: 1833: 153). ඔහු අනුරපුර රුවන්වැලි පූජාවට අනතුරුව නුවර හාත්පසින් සත් ගව්වක් පමණ තැන හැම සතුන් නොමැරිය හැක්කැයි අභය දී බෙර ලවා දොළොස් මහ වැ තන්හි මසුනට අභය දී කාම්බෝදීන්ට රන්පිළි ආදී වූ කැමති වස්තු දී පක්ෂීන් නොබඳන නියායෙන් සම්මත කරවා තිබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 78). මෙම කරුණු ප්‍රකාශ කරන ආකාරයෙහිදී යම්කිසි අලංකාර ලක්ෂණයක් දක්නට හැකි වුව ද එම කාර්යයන් මුළුමනින්ම හුදු ප්‍රලාපයකැයි බැහැර කරන්නට හේතුවක් නැත. එම නිසා මේ කරුණු නිශ්ශංකමල්ල

ශ්‍රද්ධාවන්ත බෞද්ධ රජෙකු බව එක හෙළාම ඔප්පු කරන සේ පිළිගත යුතුය.

භික්ෂූන් වහන්සේ කෙරෙහි ඔහු දැක්වූ ප්‍රතිපත්තිය විග්‍රහ කරන සඳහන් ඔහුගේ සෙල්ලිපිවල නොඅඩුව දක්නට ලැබේ. වාඳුරුප්ප ලිපියෙහි සඳහන් වන තුන් නිකා සමඟි කොට යන කියමන ද (Ancient Inscriptions of Ceylon: 1833: no. 153), දඹුලු ලිපියෙහි එන බොහෝ කල් භින්නව තිබූ තුන් නිකාහි සඟුරුවන් සමඟ කරවා යන පාඨය ද (Epigraphia Zeylanica, Vol. I, 1912: 121-135) ඔහු නිකාය සාමග්‍රියක් කළ බව කියාපායි. මෙය පරාක්‍රමබාහුගේ නිකාය සාමග්‍රිය පිළිබඳ කීර්තියට සම වන්නට කළ ප්‍රකාශයක් විය හැකිය. එහෙත් නිසැක වශයෙන්ම නිශ්ශංකමල්ලගේ කාලය වනවිට යළිදු භික්ෂූන් අතර සැලකිය යුතු ප්‍රමාණයකින් දුෂ්ප්‍රතිපන්න භික්ෂූන් සිටි බව ඔහු අවධාරණයෙන් කරන සඳහන්වලින් ඔප්පු වෙයි. රන්කොත් වෙහෙර ටැම් ලිපියෙන් පොදුවේ පිළිවෙත් සරු කුල පුත්‍රයනට ආරාධනා කරමින් වෛරී කෛරාටික පාප සත්වයන් දුරු කරන ලෙස ඔහු ඉල්ලා සිටියි (Epigraphia Zeylanica, Vol. II, 1929: no. 53). ඔහු හැට දාගේ ඇතුළු බිත්ති ලිපියෙන් සුපිළිපන් සංඝයා වහන්සේ ධර්ම විනය වූ පරිද්දෙන් පුරන පිළිවෙත් ඇතත් ශාසන රක්ෂාව ලක්දිව රජුන්ට අයත් හෙයින් ශාසන රක්ෂාවට සුදුසු අවවාද වදාරමින් ආචාර්ය උපාධ්‍යායව සිටි වහන්සේවරුන්ට ශඨ කූට කෛරාටික නුවණ නැති පාප සත්ත්වයන් නොවිචාරා මහණ නොකට යුතු යැයි බුදුන් වහන්සේ වදාළ භාෂාව මතක් කර දෙයි (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). ගුණ නැතිව ගත් මහණ වෙස් ගැන ඔහු සඳහන් කරයි. දුශ්ශීලව අනුන් පිළිබඳ අහර වැළඳීම නරකයෙහි ඉපදීමට කරුණු බව පෙන්වා දෙයි. මෙසේ සඳහන් සෑම කරුණක්ම ඔහුගේ කාලයෙහි දුසිල් මහණුන් භික්ෂූන් අතර සිටි බව ඔප්පු කරයි. ඇත්ත වශයෙන් මේ වන විට මහපැරකුම්බා ශාසන ශෝධනය කොට අවුරුදු විසි පහක් පමණවත් ගත වී ඇත. මෙය යළිත් සැලකිය යුතු තරමකින් දුසිල් භික්ෂූන් සංඝයා අතර ඇති වන්නට ප්‍රමාණවත් තරම් කාලයකි. එමෙන්ම පාරිශුද්ධ භික්ෂූන් අතරින් ඉඳ හිට

හෝ දුසිල් ගති ඇත්තවුන් මතු වුවහොත් ඔවුන් වහා කැපී මතුව පෙනෙනු නොවැළැක්විය හැකිය. නිශ්ශංකමල්ලගේ කාලයෙහි ද එහෙයින් තරමක් දුරට දුසිල් ගති ඇත්තවුන් සිටින්නට ඇති බවට සැකයක් නැත. ඔහු කියන අකාරයෙන් නිකාය තුන සමඟි කරන කථාව පිළිගත නොහැකි වුවද දුසිල් මහණුන් කෙරෙහි ඔහු අවධානය යොමු කොට ඇති බව නම් නිසැකය. ඔහු දුශ්ශීල කණ්ඨක පහ කළ බවක් සඳහන් කළත් දුසිල් මහණුන් බලෙන සිවුරු හැරවූහයි පිළිගත නොහැකිය. පරාක්‍රමබාහු දුසිල් භික්ෂූන් සිවුරු හැරවීමට රාජ බලය යෙදවූයේ මහා කාශ්‍යප වැනි මහා ස්ථවිරයන් විසින් කරන ලද විනිශ්චයෙන් පසුවය. එහෙත් නිශ්ශංකමල්ලගේ ලිපිවලවත් වංසකථාවලවත් කිසිම තැනෙක ඔහුට මෙසේ ආධාරෝපකාරීව සිටි මහතෙරවරුන් පිළිබඳව කිසිදු සඳහනක් දක්නට නොලැබේ. මහතෙරවරුන්ගේ අනුශාසනා නොමැතිව භික්ෂූන් සිවුරු හැරවීම වැනි ජනතා කෝපය එල්ලවිය හැකි අදූරදර්ශී ක්‍රියා මාර්ගයක් නිශ්ශංකමල්ල අනුගමනය කළහයි පිළිගත නොහැකිය. ඔහු වෛරී කෛරාටික පුද්ගලයන් මහණ නොකරන ලෙස ද ඔවුන් දුරු කරන ලෙස ද උපාධ්‍යාය මහ තෙරුන්ගෙන් ඉල්ලන්නේ උන්වහන්සේලා ලවා ඒ කාර්යය කරවීම සඳහාය. ඔහු මීට අනුබල දීම් වශයෙන් දුසිල් මහණුන්ට ද සසුනෙහි කළකිරුණවුන්ට ද සිවුරු හැරීමට අනුබල දීමක් වශයෙන් සසුන කිලිටි නොකර සිවුරු හළවුනට ජීවත් වීමට ක්‍රම ද නැතහොත් රන් රිදී යකඩ බත් බිජුවට සරක් ආදී වූ දෑද ලැබෙන බවට සම්මත කරවීය (Epigraphia Zeylanica, Vol. II, 1929: 77). මෙය ඇත්ත වශයෙන් ඔවුන් බලෙන් සිවුරු හැරවීමට වඩා බෙහෙවින් දූරදර්ශී ප්‍රතිපත්තියකි. ඇත්ත වශයෙන් සමහර පුද්ගලයන් විහාරස්ථ ජීවිතය වෙත ඇදී ගියේ ලෞකික වාසි හා ගරුත්වය ලැබීමේ බලාපොරොත්තුව නිසාය. විහාරයේ විනයානුකූල ජීවිතයට යෝග්‍ය නොවූ පුද්ගලයන් එය හැරදා යෑමට මැලි වූයේ ද ඉන් ලද ලෞකික පල ප්‍රයෝජන තව දුරටත් භුක්ති විඳීමට ඔවුන්ට වුවමනා වූ නිසාය. තමන් විසින් සංඝ සමාජය පිරිසුදු කිරීම ගැන පවසන නිශ්ශංකමල්ලගේ රුවන්වැලි සෑ අභිලේඛනයෙහි මේ ප්‍රශ්නය වඩා පැහැදිලිව ප්‍රකාශ වී තිබේ. අපවිත්‍ර ජීවිත ගත කරන්නා වූ භික්ෂූන් ද විහාරස්ථ ජීවිතය ගැන

වූ වුවමනාව හා ඇල්ම පහ වී ඇති භික්ෂූන් ද ශාසනයෙන් බැහැර වී නොයන්නේ රාජකාරී එනම් ගිහියන් විසින් යුතුකමක් වශයෙන් ආණ්ඩුව වෙනුවෙන් ඉටු කළ යුතු කාර්යයන් ගැන වූ බිය නිසා බැව් මහරජතුමාණෝ අවබෝධ කර ගත්හ. එබැවින් සසුන කිළිටි නොකර සිවුරු හැර දා යන භික්ෂූන් මෙබඳු රාජකාරී කටයුතුවලින් නිදහස් කරන බව ද ඒ හැර ඔවුන්ට රන්, වස්ත්‍ර, ආහාර, යකඩ, බිත්තර වී, හරක් සහ වෙනත් අවශ්‍යතා දෙන බව ද ඔහු ප්‍රකාශ කළේය. නියමිත ගුණ දහම් පුරන්නේ නැතිව තමන්ට සපයා ඇති පහසුකම් භුක්ති විඳීම පමණක් කරන්නන් නිසැකවම නිරයෙහි උපදින බැව් නිශ්ශංකමල්ල වෙනත් අභිලේඛනයකින් මතක් කරදී තිබේ (ගුණවර්ධන 1993: 141). වංචනික කපටි හා පච්කාර මිනිසුන් ශාසනයට ඇතුලු වීම වලක්වනු වස් දැඩි පරීක්ෂණයකින් පසුව පමණක් අලුතින් පැවිදි බිමට ඇතුලු කර ගන්නා ලෙස නිශ්ශංකමල්ල සංඝයාට උපදෙස් දුන්නේය (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). නිශ්ශංකමල්ල භික්ෂූන්ගේ ආධ්‍යාත්මික උපදේශකයා වීමේ කාර්යභාරය තමන් වෙත පවරා ගන්නා ලද බව පෙනේ. හැටදාගේ සහ රන්කොත් වෙහෙර අභිලේඛන මගින් ඔහු අලුතින් මහණ කර ගැනීමේ ප්‍රශ්නය පිළිබඳව ඔවුන්ට උපදෙස් සපයයි. අනලසව ශික්ෂාවන් රකින ලෙස ඔවුන්ට නියම කරයි. රජවරුන් සංඝයාගේ විනයානුගත වැඩ කටයුතුවලදී ප්‍රමුඛ හා අවශ්‍ය කාර්යභාරයක් ඉටු කළ බැව් ඉහතදී කළ සාකච්ඡාවෙන් පෙනේ. මේ හැරෙන්නට රජයේ ධනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ශාසනයට අනුග්‍රහ දැක්වීම සඳහා ද ආගමික වත්පිළිවෙත් හා උත්සව පැවැත්වීම සඳහා ද නිශ්ශංකමල්ල වැය කර තිබේ. උත්සව දෙකක් පමණක් සඳහා නිශ්ශංකමල්ල රන් කාසි 4700000 ක් වියදම් කළ බවට හිමිකම් කියා තිබේ (ගුණවර්ධන 1993: 141). එමෙන්ම ධර්ම දේශනා පැවැත්වීම සඳහා ශාලා ඉදි කළේය (Epigraphia Zeylanica, Vol. II, 1929:165-178). මෙම කරුණු නිසා ඔහු පරාක්‍රමබාහු විසින් කළ භාරදූර නිකාය සාමග්‍රිය වැන්නක් නොකළ ද භික්ෂූන් අතර පාරිශුද්ධිය ඇති කරවීම කෙරෙහි අවධානය යොමු කර තිබේ. ඔහු ශාසනාරක්ෂාවට සුදුසු අවවාද දෙමින් විශේෂ සෙල්ලිපි දෙකක් පිහිටුවා ඇත. ඉන් එකක් වූ හැටදාගේ ඇතුළු බිත්ති ලිපියේ ධර්ම

විනය වූ පරිද්දෙන් පිළිවෙත් පුරන සුපිළිපන් සංඝයා වහන්සේ ඇත ද ශාසනාරක්ෂාවට ලක්දිව රජුන්ට ඇති අයිතිය මතක් කර දෙමින් භික්ෂූන් වහන්සේට අවවාද දීමට ඉඩ පාදා ගත්තේය (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). අනෙක් වෙහෙර වූ රන්කොත් වෙහෙර ටැම් ලිපියෙන් භික්ෂූන්ට ග්‍රන්ථ විදර්ශනා ධූරයෙහි නොපමාව මෛත්‍රී කරුණාදී කමටහන් භාවනාවෙහි යෙදෙමින් සර්ව සත්ත්වයන් කෙරෙහි සිත ස්ඵරණය කරන ලෙස භික්ෂූන්ගෙන් ඉල්ලා සිටියි. භික්ෂූන්ට ආත්මාරක්ෂාවෙහි ද අප්‍රමාද වන ලෙස ඉල්ලා සිටියි. තමනට සිවු පසයෙන් උපස්ථාන කරන ගිහියන්ට ස්වර්ග සම්පත් සාදා දීම පිළිබඳව භික්ෂූන් කෙරෙහි ඇති වගකීම ද මතක් කරයි (Epigraphia Zeylanica, Vol. V, 1955: 268).

හැටදාගේ ඇතුළු බිත්ති ලිපියේ සඳහන් වන "ශ්‍රද්ධා බුද්ධි පූර්වංගමවැ සුපිළිපන් සංඝයා වහන්සේ ඇතද ශාසන රක්ෂාව ලක්දිව රජුන් අයිති හෙයින්" යන පාඨය විමර්ශනයට භාජනය විය යුත්තකි. මෙම කියමනට අනුව එක් අතකින් රජුගේ අවවාද සහ අනුග්‍රහය අනවශ්‍ය තත්ත්වයක ශාසනය පැවතුණ බවත් හැඟේ. ඔහු මෙම තත්ත්වය ලබා ගත්තේ නිකම්ම රජෙකුට ශාසන රක්ෂාවට ඇති අයිතිය මතක් කර දෙමිනි. එසේ නම් රාජකීය අවවාදයෙන් හා අනුග්‍රහයෙන් ශෝධනය කළ යුතු කණ්ඨක එවක භික්ෂු සංඝයා අතර නොපැවතිණි ද ඔහුගේ අන් ලිපිවල සඳහන් කරුණු ද සලකන විට ප්‍රමාණවත් තරම් දූෂිත භික්ෂූන් සිටියහ යි පිළිගත හැකි බව පෙනේ. ඊළඟට පොදුවේ භික්ෂූන් වහන්සේ ඔහු කෙරෙහි ලෙන්ගතු බවක් නොදැක්වූද යන ප්‍රශ්නය මතු වේ. ඔහුගේ සෙල්ලිපිවල හෝ වංසකථා සඳහන්වල අන් රජුන්ට මෙන් අනුග්‍රාහකව සිටි මහතෙරවරුන් ගැන කිසි සඳහනක් නොලැබෙන බව ද දැකිය හැකිය. මෙය ඇත්ත වශයෙන් ආගම තම දේශපාලන වාසිය සඳහා උදව් කර ගන්නට උත්සාහ දැරූ විජාතීය රජෙකු කෙරෙහි ලක්දිව භික්ෂු සංඝයා දැක්වූ උදාසීන ආකල්පය කියාපාන ස්ථානයක්දැයි අවධානය යොමු කිරීම වටියි. ඔහු පිළිවෙත් සරු භික්ෂූන් ඇති බව පිළිගනී. එමෙන්ම ශඨ කූට කෛරාටික නුවණ නැති පාප සත්ත්වයන් ද

ඔවුන් අතර ඇති බව පෙන්වා දෙයි. එබන්දන් දුරු කරන ලෙස ද ඉල්ලා සිටියි. ඔහු සිව්පසයෙන් උපස්ථාන කොට තිබෙන්නේ ද සුසිල් මහ සඟනටය (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). ඔහු මෙසේ සුශීල හා දුශ්ශීල භේදය අවධාරණය කරන ආකාරය ද ශඨ කූඨ කෛරාටික යැයි එක් භික්ෂු කොටසක් හඳුන්වා දී ඇති ආකාරය ද ස්ථිර වශයෙන්ම ඔහුගේ කෝපයට භාජනය වූ එක් භික්ෂු කොටසක් සිටි බව ඔප්පු කරන්නකි. ඔවුන් ඇත්ත වශයෙන්ම දුශ්ශීල ද විය හැකිය. ඔවුන්ගේ වරද දුශ්ශීල වීම පමණක් නම් ශඨ කූඨ කෛරාටික යන විශේෂණ යොදන්නට එතරම් අවශ්‍යතාවක් නොපෙනේ. ඔවුන් රජුගේ උදහසට භාජනය වන්නට ඇත්තේ දේශපාලන හේතු අනුව නම් ශඨ කූඨ කෛරාටික යන විශේෂණවලට අර්ථයක් ලැබේ. ඇත්ත වශයෙන්ම විජාතික විදේශික නිශ්ශංකමල්ලට සිටි ප්‍රබල විරුද්ධ පක්ෂය සිහි කරන විට ඔවුන් හා පක්ෂව රජුට දේශපාලනමය වශයෙන් විරුද්ධකම් පෑ භික්ෂු පිරිසක් සිටියහයි පිළිගැනීමට ඉඩ තිබේ. එසේ නම් ඔහු ඔවුන්ට කෛරාටික පාපී ශඨ කූඨ යන විශේෂණ යෙදීමේත් සුශීල භික්ෂූන් වෙසෙසා දැක්වීමේත් අර්ථයක් තිබේ. ඔහුගේ යුගයේ සඳහන් වන එක් තෙරුන් වහන්සේසේ කෙනෙක්ගේ නමක් දක්නට ලැබේ. ඒ සාධුචරිතෝදය ලියූ අඹගමු වැසි සුමේධ ස්ථවිරයන් වහන්සේය. උන්වහන්සේ මහාවංස හෙවත් ක්ෂත්‍රිය වංශයෙහි උපන් කෙනෙකි. උන්වහන්සේ වුවද සාධු ගුණ සම්පන්න පුද්ගලයන් ගැන කථා ඉදිරිපත් කරමින් පොත ලියන්නේ රජුගේ සභාපති ගජභුජගේ ආරාධනයෙන් බව සඳහන් කරයි. ශාසන රක්ෂාව සඳහා රජු දැක්වූ උනන්දුවට ලක්දිව භික්ෂු සංඝයාගෙන් ක්‍රියාකාරි සහයෝගයක් නොලැබිණිදැයි ගැටලුවක් මතු වේ. රජු වෙනුවෙන් එබඳු කාර්යයනට ඉදිරිපත් වන මහතෙරවරු නොසිටියාහු ද යන ප්‍රශ්නයත් මෙහිදී ඉස්මතු කළ හැකිය. ශිලාලේඛන විශාල සංඛ්‍යාවකින් පමණක් නොව සාක්ෂි දැකගත හැකි ආගමික ගොඩනැඟිලි රැසකින් ද තමා විසින් බුද්ධ ශාසනයට කරන ලද අපරිමිත සේවාව ප්‍රකාශ කර සිටි රජෙකු මහාවංසය ලියූ යතිවරයන් විසින් ගාථා නවයකින් පමණක් සඳහන් කර තිබීම ද ඉහතින් සඳහන් කළ ප්‍රශ්න නැගීමට තවද ඉඩ සලසයි. තමාට විරුද්ධ පක්ෂයක් සිටිය ද

මෙසේ සුපිළිපන් භික්ෂූන්ට සංග්‍රහ කිරීමෙන් ලැබිය හැකි බෞද්ධ ජනාදරය නොසලකා හරින්නට තරම් නිශ්ශංකමල්ල අදූරදර්ශී පාලකයෙක් නොවීය. ඔහු සුසිල්වත් මහ සංඝයාට සිව් පසයෙන් උපස්ථාන කළේය (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). ඔවුන්ට පලිබෝධ නොවුවමනා වේදැයි ඔවුන්ගේ නෑදෑයින්ට ද නොයෙක් වස්තුවෙන් සංග්‍රහ කළේය (Epigraphia Zeylanica, Vol. II, 1929: 77). ධර්මධර ශාස්ත්‍රධර පඬිවරුනට අනුරූප වෘත්ති දුන්නේය. කඨින දාන, දේව දාන, දරු කුසලාන් පෙර පරිද්දෙන් තබා දුන්නේය. අවුරුදු පතා මහණුවම් කරවීය (Epigraphia Zeylanica, Vol. II, 1929: 106). මහාවංසයට අනුව තමාගේ නමින් ප්‍රාසාද සියයකින් යුත් විහාරයක් කරවා භික්ෂු සංඝයාට පිරි නමා තිබේ (ඌනපූරණසහිතො මහාවංසො 1959ඃ පරි. 78ඃ 21 ගාථාව). ගල්පොත ලිපියෙහි රන් කොත් දා ගැබ සිසාරා දොරටු පවුරු සංඝාරාම කර වූ බව ඔහු කියයි (Epigraphia Zeylanica, Vol. II, 1929:108). මීට අමතරව ඔහු විසින් ශාසනයට දායාද කළ ආගමික ගොඩනැගිලි කීපයක් ද සඳහන් කළ හැකිය. එනම් පොළොන්නරුවේ රන් කොත් වෙහෙර (Epigraphia Zeylanica, Vol. II, 1929: 108; Ancient Incriptions of Ceylon 1833: No. 153; Epigraphia Zeylanica, Vol. II, 1929:135; Epigraphia Zeylanica, Vol. II, 1929:108), වටදා ගෙය (Ancient Inscriptions of Ceylon 1833. No. 94; Epigraphia Zeylanica, Vol. II, 1929: 168-171), හැටදා ගෙය (Epigraphia Zeylanica, Vol. II, 1929: 87), නිශ්ශංකලතා මණ්ඩපය (Journal of the Ceylon Branch of Royal Asiatic Society, X, 68), සංඝාරාම විහාරය (ඌනපූරණසහිතො මහාවංසො 1959ඃ පරි. 78ඃ 21 ගාථාව) ඒ අතරින් ප්‍රධානත්වයෙහි ලා සැලකේ. මේ හැර නිශ්ශංකමල්ල අගනුවරින් බැහැර ප්‍රතිසංස්කරණය කර වූ නොයෙකුත් වෙහෙර විහාර ගැන සඳහන් දක්නට ලැබේ. රුවන්වැලි පූජෝත්සවයට ගිය ගමන අනුරපුර මිරිසවැටිය ආදී වූ විහාර කරවීමට අනන්ත වස්තු හා වී යාළ සිය ගණනක් දී තිබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 78). ඔහු ප්‍රතිසංස්කරණය කර වූ වෙහෙර අතර මැඬිලිගිරියල කැලණිය හා මහියංගණ මහ වෙහෙර ද සඳහන් වෙයි. මේවා කරවා ඒවාට ඔහු අනන්ත වස්තු පරිත්‍යාග කොට

මහා පූජා පවත්වා තිබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 106). මෙම ප්‍රතිසංස්කරණයන් අතර දඹුලු විහාර ප්‍රතිසංස්කරණය විශේෂයෙන් සඳහන් කළ හැකිය (Epigraphia Zeylanica, Vol. II, 1929: 170, 106, 130 ). ඔහු ශ්‍රී පාදස්ථානයට ගොස් සිරි පතුළ වැඳ ශ්‍රී පාද ස්ථානයට කළ පරිත්‍යාග ගැන හගවා ලෙන ලිපිය කියයි. ශ්‍රී පාදස්ථානයට කලින් අයත්ව තිබූ හෙවත් විජයබාහු විසින් දෙන ලද අඹගමුව පසුව රජවරුන් විසින් ආපසු පවරා ගෙන තිබූ හෙයින් එය යළි ශ්‍රී පාදස්ථානයට පවරා දුන් බව සඳහන් වේ. ඒ සමග තවද ගම් කීපයක් ඔහු ශ්‍රී පාදස්ථානයට පූජා කර තිබේ (Ceylon Journal of Science, Section G., II, 1930: 20-21).

පොළොන්නරු යුගයේ භික්ෂූන් වහන්සේලාගේ සමාජ ජීවිතය සම්බන්ධයෙන් පාලකයන් සහ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ වූ ආකාරය සඳහන් කිරීම ද මෙහිදී වැදගත් වන්නේය. ආචාර්යවරුන් ධර්මදේශකයන් උපදේශයන් වශයෙන් මෙන්ම වෛද්‍යවරුන් හා ජ්‍යෝතිශ්ශාස්ත්‍රඥයන් වශයෙන් ද භික්ෂූන් වහන්සේලා සමාජයට සේවය කළ බව පෙනේ. පළමුවැනි විජයබාහු රජතුමා සිහසුනට පත් වූයේ භික්ෂූන්ගේ ඇරයුමෙන් බුදුසසුන ආරක්ෂා කිරීමට යැයි වේලෙක්කාර සෙල්ලිපියේ සඳහන් වේ (Pathmanathan 2019: 476-478). භික්ෂූන් වහන්සේලා රටේ පාලකයා පත් කිරීමේදී දේශපාලනය මැදිහත් වූයේ රටත් ජාතියත් ආගමත් ආරක්ෂා කර ගැනීමේදී පවිත්‍ර චේතනාවෙන් බව පැහැදිලිය. එපමණක් නොව භික්ෂු ශාසනයේ සහාය නොමැතිව රජුට බලයේ රැඳී සිටීමට පහසු නොවූ බව ද සිතිය හැකිය. උපරාජ ධූරය දැරූ වීරබාහු මිය ගියවිට පළමුවැනි විජයබාහු විසින් භික්ෂූන්ගේ අදහස් විමසා ඔවුන්ගේ උපදෙස් අනුව එම තනතුරට ජයබාහු පත් කරන ලදි (ඌනපූරණසහිතො මහාවංසො 1959: 60: 87). රජකමට අනුප්‍රාප්තිකයෙකු තේරීම සඳහා භික්ෂූන් සහභාගි වූ ඉතාම වැදගත් චාරිත්‍රානුකූල සම්මේලනය පවත්වන ලද්දේ පළමුවැනි විජයබාහුගේ මරණයෙන් පසුවය. රජුගේ මරණය පිළිබඳ පුවත රෝහණ දේශයේ ආණ්ඩුකාර ධූරය දැරූ ඔහුගේ පුත් වික්‍රමබාහුට නොදන්වන ලදි. ප්‍රමුඛ ආයතනවල

භික්ෂූහු ද රාජධානියේ උසස් ප්‍රභූවරු ද රජුගේ සොහොයුරිය වූ මිත්තාගෙන් හා ඇගේ පුතුන් තිදෙනාගෙන් උපදෙස් ලබා ගෙන ජයබාහු රජු වශයෙන් අභිෂේක කිරීමට තීරණය කළහ. මිත්තාගේ පුතෙකු වූ මානාභරණ උපරජු වශයෙන් පත් කිරීමේදී ඔවුහු වික්‍රමබාහුගේ අයිතිවාසිකම් නොතකා හැරියහ. භික්ෂූන් ද අර්ධ වශයෙන් වගකිව යුතු වූ මේ ක්‍රියාව සිරිත් පරිදි අනුගමනය කළ යුතු වූ ක්‍රියා පිළිවෙල උල්ලංඝනය කිරීමක් ලෙස තමනුත් භික්ෂුවක් වුණත් මහාවංසයේ කතෘවරයා විසින් විවේචනය කර තිබේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 61: 1-4). මේ තීරණය ගැනීමට භික්ෂූන්ට විශේෂ හේතුවක් තිබෙන්නට ඇත. නමුත් බෙහෙවින්ම මතභේදයට ලක් වූ තීරණයක් ගැනීමට ඔවුන් ද ප්‍රඥාගෝචර නොවූ අන්දමින් සම්බන්ධ වීම සංඝයාටත් රාජධානියටත් විපත්තිදායක තත්ත්වයක් බිහි කිරීමට හේතු විය. රජකම සඳහා දිගින් දිගට කෙරුණු යුද්ධයක් ඇවිලවීමට ඉන් මග පෑදිණ. එහි ප්‍රතිඵලය වූයේ දිවයින තරගකාරී රාජධානි තුනකට බෙදනු ලැබීමයි. රාජ්‍ය නායකයන්ගේ යුතුකම බුදු සසුන ආරක්ෂා කිරීම යැයි නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපියක ද සඳහන් වේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 97). එසේම භික්ෂූන් වහන්සේලා ද දේශපාලන ක්ෂේත්‍රය අවුල් වූ විට ඊට මැදිහත් වූ බවට සාක්ෂි තිබේ. පරාක්‍රමබාහු හා ගජබාහු අතර ඇති වූ ගැටුමේදී භික්ෂූන් වහන්සේලා මැදිහත් වී ගිවිසුමක් ඇති කර ගෙන මණ්ඩලගිරි විහාරයෙහිදී එය ලේඛන ගත කළ බව පෙනේ. මේ ලේඛනයේ පිටපතක් කුරුණෑගල සංගමුව විහාරයෙන් ලැබී ඇත (Epigraphia Zeylanica, Vol. IV, 1934 : 1-8). මෙයින් පැහැදිලි වන්නේ රාජ්‍ය මට්ටමේ අභ්‍යන්තර දේශපාලන අවුල්වලට මැදිහත් විය හැක්කේ භික්ෂූන්ට පමණක් බවයි. රෝහණයේ විසූ මානාභරණ රජු හා දෙවැනි ගජබාහු රජු අතර ඇති වූ අරගලයේදීත් මැදිහත්ව කටයුතු කළේ භික්ෂූන් වහන්සේලාමය. දේශපාලන ක්ෂේත්‍රයට මෙබඳු අන්දමින් මැදිහත් වීම අවස්ථාවෝචිතව භික්ෂූන් විසින් කරන ලද්දක් විනා භික්ෂු ජීවිතයට අහිතකර අන්දමින් කරන ලද්දක් බව නොපෙනේ. භික්ෂූන් හැරුණු විට එවැනි අවස්ථාවකදී රට අවුලින් බේරා ගැනීමට ඉදිරිපත් වීමට වෙන කිසිවෙක් සමත් නොවූහ. පොළොන්නරුව යුගයේදී බුද්ධාගම

හා සම්බන්ධ පොදු ජන උත්සව ප්‍රචලිත කිරීමට රජවරු ප්‍රයත්න දැරූහ. මේ අනුව භික්ෂූන් වහන්සේලා ගිහි සමාජයේ ශ්‍රද්ධාව හා ප්‍රසාදය දියුණු කෙරෙන උත්සවවලට සහභාගි වූ බවට සාක්ෂි ඇත. බුද්ධ ප්‍රතිමාවකට නේත්‍රා පිහිටුවීමේ උත්සවයක් වාර්ෂිකව පැවති බවට වේලෛක්කාර ශිලාලේඛනයෙන් අනාවරණය වේ (Pathmanathan 2019: 476-478). මේ උත්සවයේ ස්වරූපය කෙබඳුදැයි දැන ගැනීමට සාධක නොමැති වුව ද ඊට භික්ෂූන් වහන්සේලාගේ සහභාගිත්වය සිදු වූ බව නිසැකය. පළමුවැනි පරාක්‍රමබාහු රජු වාර්ෂිකව වෙසක් උත්සවයක් පැවැත්වූ බව පූජාවලියේ සඳහන් වේ (පූජාවලිය 1930: 106). නිශ්ශංකමල්ල රජු රන් කාසි හතළිස් දහසක් උත්සව සඳහා වැය කළ බව සඳහන් වේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 80). මෙවැනි පොදු ජන උත්සව තුළින් බෞද්ධ ප්‍රබෝධයක් ඇති කළාක් මෙන්ම රජු රට වැසියා හා භික්ෂූන් වහන්සේ අතර සුහදතාවයක් නිසැකයෙන්ම ගොඩනැගෙන්නට ඇත. භික්ෂූන් වහන්සේලා පරිත්‍රාණ ධර්ම දේශනාව ජනප්‍රිය උත්සවයක් බවට පත් කළ බවට සාක්ෂි තිබේ. නියඟය, වසංගතය, ජල ගැල්ම සහ යක්ෂෝපද්‍රාව වැනි සිදුවීම්වලින් රට බේරා ගැනීමට පිරිත් දේශනා ඉවහල් වූ බව ජනතාව විශ්වාස කළහ. පරාක්‍රමබාහු රජු ද පිරිත් දේශනාව සඳහා "පංචසත්තති" නමින් මන්දිරයක් කර වූ බවත් නිශ්ශංකමල්ල රජු පිරිත් ඇසීම සඳහා නිශ්ශංකලතා මණ්ඩපයක් කර වූ බවත් දැක් වේ. විහාරස්ථානයන්හි පැවති උත්සවවලදී මංගල සූත්‍රය සජ්ඣායනා කළ බවත් අවමංගල උත්සවවලදී තිරෝකුඩ්ඩ සූත්‍රය දේශනා කළ බවත් මේ යුගයේ රචිත ග්‍රන්ථයක් වන සාරත්ථදීපනියෙහි සඳහන් වේ (සාරත්ථදීපනී 1933: 819-820). දළදාව සඳහා පෙරහැරක් ද පැවැත්වූ බව දළදා සිරිතෙහි සඳහන් වේ. මෙවැනි පොදු ජන උත්සව වර්ධනය වීමෙන් බුද්ධාගම ජනප්‍රිය ආගමක් වූ බව බොහෝ දෙනෙකුගේ මතයයි. සොළීන්ගෙන් රාජරට්ඨ දේශය මුදා ගැනීමෙන් පසු පළමුවැනි විජයබාහු පැවිදි කිරීමේ උත්සවයක් පැවැත්වීය (ඌනපූරණසහිතො මහාවංසො 1959: 60: 4-8). පළමුවැනි පරාක්‍රමබාහු ද මහවැලි ගඟ මැද නැංගුරම් ලා නතර කළ ඔරු මත ඉදි කළ මණ්ඩපයක එබඳු උත්සවයක් හැම අවුරුද්දකදීම පැවැත්වීය (ඌනපූරණසහිතො මහාවංසො 1959:

78: 28-30). නිශ්ශංකමල්ල ද පැවිදි කිරීමේ උත්සවයක් අවුරුදු පතා පැවැත්වූ බැව් කියනු ලැබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 111). බුදුන් වහන්සේගේ ජීවිතයේ ප්‍රධාන සිද්ධීන් සමග සම්ප්‍රදායානුකූලව සම්බන්ධ කොට ඇති වෙසක් මාසයේ පසළොස්වක් දිනය ආගමික කටයුතු සඳහා විශේෂයෙන් යෝග්‍ය යැයි සලකනු ලැබිණි. පළමුවැනි පරාක්‍රමබාහු අවුරුදු පතා වෙසක් උත්සවය පැවැත්වූයේය (පූජාවලිය: 1930: 106). හැම මාසයේම පසළොස්වක් පෝ දිනය සම්ප්‍රදායානුකූලව දන්දීම අටසිල් ගැනීම හා වත් පිළිවෙත් කටයුතු සඳහා වෙන් කරනු ලැබිණ. පළමුවැනි විජයබාහු සහ පළමුවැනි පරාක්‍රමබාහු උපෝසථ දිනවල අට සිල් සමාදන් වූහ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 60: 21ත 74:40). විහාරස්ථානය වනාහි හුදෙක් වත් පිළිවෙත් පැවැත්වීම සඳහා වූ ස්ථානයක් පමණක් නොවීය. කවදත් එය ජනයාට එක්රැස් විය හැකි වූද ධර්ම දේශනාවලට සවන් දිය හැකි වූ ද ආගමික සාකච්ඡාවලට සහභාගි වීමට හැකි වූ ද තැනක් වූයේය. පළමුවැනි විජයබාහු තෑගි දීමෙන් දේශකයන්ට අනුබල දී ඇත (ඌනපූරණසහිතො මහාවංසො 1959: 60:20). පළමුවැනි පරාක්‍රමබාහු සහ නිශ්ශංකමල්ල ධර්ම දේශනා පැවැත්වීම සඳහා ශාලා ඉදි කළහ (ඌනපූරණසහිතො මහාවංසො 1959: 73:72, 82; Epigraphia Zeylanica, Vol. II, 1929: 165-178). පළමුවැනි පරාක්‍රමබාහු ජාතක කථා කීම සඳහා දේශකයෙකු පත් කළේය. ඒ සඳහා විශේෂ ශාලාවක් ඉදි කළේය (ඌනපූරණසහිතො මහාවංසො 1959: 73:72). සිද්ධස්ථානවල මේ වකවානුවේදී කළ චිත්‍රවලින් ජාතක කතාවල ජනප්‍රිය භාවය පෙන්නුම් කරයි. එබැවින් සියවස් දෙකක් පමණ කාලයක් තුළ පැවති පොළොන්නරු යුගයෙහිදී යළිත් බුදුසමය හා භික්ෂු ශාසනය ක්‍රියාශීලි වූ බව පැහැදිලි වේ.

පොළොන්නරුව යුගයේ රාජත්වය සහ බෞද්ධාගම අතර පැවති සම්බන්ධතා පිළිබඳව විවරණයකට ලක් කෙරෙන මෙම ලිපියේදී දළදා වහන්සේ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දැක්වීම ද සුවිශේෂී වන්නේය. මෙම සමය වනවිට දළදා වහන්සේ රාජ්‍යත්වයේ සංකේතය වන නිසාය. අනුරාධපුර යුගයෙන් පසු පාලන කේන්ද්‍රස්ථානය පොළොන්නරුවට සංකේන්ද්‍රගත වීමත්

සමගම දළදාව හා සම්බන්ධිත වූ ආකල්පවල ද වර්ධනයක් ද දැකිය හැකි අතර රාජත්වය හා දළදාව අතර සංකේතාත්මක සම්බන්ධතාව ද වඩාත් සමීප වේ. දළදා වහන්සේ අදාළ ස්ථානයට වැඩමවා ගෙන ඇති හැකියාව මීට එක් හේතුවක් වන්නට ඇති අතරම පාලනමය වශයෙන් බෙදුණු රටක් තුළ ප්‍රධාන පාලකයා කවරෙක් ද යන්න හා ප්‍රධාන බල කේන්ද්‍රය නිශ්චය කිරීමේදී ද එක් සාධකයක් බවට දළදාව පත්වන බව පැහැදිලි කරුණකි. දළදාව වැඩ සිටීම තුළින් ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටීමක් සේ සැලකීම මෙහි ගැබ්ව ඇති යථාර්ථය වේ. පොළොන්නරු යුගයේ සිටම මෙම තත්ත්වය වඩාත් පැහැදිලි වේ. දළදාව යමෙකු සතු වේ නම් ඔහුට සිංහල ඔටුන්න හා ප්‍රමුඛත්වය හිමිවේය යන සංකල්පය ද ක්‍රමයෙන් ජන විඥානය තුළ වීමක් ද දැකිය හැකිය (Journal of the Royal Asiatic Society, Vol. XIV: 105). පළමුවැනි විජයබාහු රජු විසින් දළදා වහන්සේ වෙනුවෙන් අටදාගේ නම් නව මැඳුරක් ඉදි කොට දැඩි ආරක්ෂාව පතා වේලෛක්කාර හමුදා භාරයට පත් කළ බව පොළොන්නරු වේලෛක්කාර පුවරු ලිපියේ දැක්වේ (Pathmanathan 2019: 476-478). රජුගේ අණ පරිදි නුවරකල් දේව සෙන්පති විසින් මෙම මාළිගය ගොඩනංවා ඇත (Pathmanathan 2019: 476-478). විජයබාහු පොළොන්නරුවේ රජ වූ පසු දළදා වහන්සේ වෙනුවෙන් රමණීය වටිනා මැඳුරක් කර උත්කර්ෂවත් අන්දමින් උත්සවයක් ද පවත්වා ඇත. දළදා වහන්සේ සම්බන්ධයෙන් ගොඩනංවන ලද මෙම ස්ථානය ප්‍රථමාභිෂේකය සිදු වූ ස්ථානය ලෙසින් ද සැලකේ (Pathmanathan 2019: 476-478). විජයබාහු රජු තම මිත්‍ර බුරුම රජු වෙත දළදා වහන්සේගේ අනුරුවක් යැවීමට තරම් භක්තිමත් විය (Harvey 1925: 32). මෙලෙසින් රාජත්වයේ ප්‍රමුඛ සංකේතයක් බවට දළදා වහන්සේ පත් වූ අතර එතැන් පටන් ලංකාවේ පාලක පිරිස් රාජත්වයේ ආධ්‍යාත්මික සංකේතය ලෙසින් ද දළදාව සැලකූ අතර දළදා වහන්සේගේ භාරය සිටතට ගැනීම මෙන්ම දළදා වහන්සේට රැකවරණය හා පුදපූජා පැවැත්වීම සිය ප්‍රධාන කාර්යයක් ලෙසින් ද සැලකීමට නිරතුරුවම උත්සුක වූ බව පැහැදිලිය. පළමුවැනි පරාක්‍රමබාහු දෙවැනි ගජබාහුගෙන් රජරට ප්‍රදේශයේ බලය සිතට ගැනීමට සමත් වුව ද ඔහුගේ එකම අභිප්‍රාය වූයේ කෙසේ හෝ

දළදා වහන්සේ ද තමන් සතු කර ගනිමින් රාජත්වයේ නියම උරුමකාරිත්වය ලබා ගැනීමය. මාණාභරගෙන් පසු දළදාවේ අයිතිය සුගලා බිසව සතු වූ අතර ඇය දළදාව ද තබා ගනිමින් පොළොන්නරුවේ නායකත්වය ද අපේක්ෂා කළාය. දළදාව සුගලා බිසව සතුව පැවතීම මත දකුණේ විසූ සාමන්තයෝ පරාක්‍රමබාහුගේ ආධිපත්‍ය නොපිළිගෙන සුගලාගේ නායකත්වය පිළිගැනීමට පෙළගැසුනහ. එම නිසා රාජත්වය සුරක්ෂිත වීම කෙරෙහි දළදාව ද අත්‍යවශ්‍ය කරුණක් ලෙසින් පළමුවැනි පරාක්‍රමබාහු සැලකීය. පළමුවැනි පරාක්‍රමබාහු රජු අතිශයින් විසිතුරු දළදා මාළිගයක් කරවා තිබේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 59:61). මෙලෙසින් දළදා මැඳුරක් ඉදි කිරීම තුළින් පරාක්‍රමබාහු කෙතරම් දුරට දළදා වහන්සේ අපේක්ෂාවෙන් කල් ගෙවන ලද්දේ ද යන්න සිතිය හැකිය. පළමුවැනි පරාක්‍රමබාහු රජු නායකත්වයට පත්ව සිව්වැනි වසරේදී ලත් ප්‍රධාන ජයග්‍රහණය ලෙසින් දළදාව තමා නතු කර ගැනීම දැක්වේ. මහින්ද නම් ඇමතියකු විසින් පොළොන්නරුවේ ගොඩනංවන ලද විජයොත්පාය නම් මාළිගයක දළදාව තැන්පත් කර පුදපූජාවන් පවත්වා ඇත. පරාක්‍රමබාහු දවස දළදා වහන්සේ වෙනුවෙන් මාළිගා තුනක් කළ බව දැක්වේ (ඌනපූරණසහිතො මහාවංසො 1959: පරි. 72: 299-300). එමගින් ද රාජ්‍යය තුළ කෙතරම් තත්ත්වයක් දළදා වහන්සේට හිමිව පැවතියේ ද යන්න තීරණය කළ හැකිය. පළමුවැනි පරාක්‍රමබාහු සමයෙහිදී පෙරහැරින් නගරය වටා ගෙන යන ලදි. මහාවංසයේ මේ උත්සවය පිළිබඳව විස්තරයක් සැපයෙයි (ඌනපූරණසහිතො මහාවංසො 1959: 74:198-248). මැණිකක් තුළ කුහරයක් හාරා එය සුවඳ කළ විලේපයකින් පුරවා ඒ තුළ දළදාව බහාලන ලදි. ඉන්පසු ඒ මැණික තවත් මාණික්‍යමය කරඬුවක් තුළ ද එම කරඬුව රත්රන් කරඬුවක් තුළ ද තැන්පත් කරන ලදි. මේ කරඬුව ද පාත්‍රා ධාතුව ද රනින් සෑදූ රෝද සවි කළ මණ්ඩපයක් තුළ වූ අසුනක් මත තබන ලදි. ලම්බකණ්ණවරුන් සහ වෙනත් වංශවත් පුද්ගලයන් විසින් මණ්ඩපය මුර කරනු ලැබිණ. ඔවුන් අත චාමර ඡත්‍ර හා කඩු ද විය. මණ්ඩපය පිරිවරා ගත් සිය ගණන් වාහන තුළ ඒවායේ නාට්‍යාංගනාවෝ ද සංගීත වාදකයෝ ද වූහ. තම ප්‍රභූන් විසින් පිරිවරා ගනු ලැබූ රජු ඇතකු පිට නැගී

ධාතුන් වහන්සේලා කැටුව ගමන් කළේ නිරන්තරයෙන් පුදපූජා පවත්වමිනි. සිද්ධස්ථානය වෙත ධාතු ආපසු ගෙන ඒමෙන් පසු ඒවා වෙනුවෙන් දින හතක් තිස්සේ පහන් පූජා පවත්වන ලදි. පළමුවැනි පරාක්‍රමබාහු රාජ සමය දළදා වහන්සේ හා රාජත්වය අතර ඉතා සමීප බවක් මෙන්ම රාජත්වය ශක්තිමත් කළ සංකේතයක් ලෙසින් දැක්විය හැකිය. දළදා වහන්සේගෙන් තොර වූ දේශය හිස් බවත් රාජ්‍යය නිෂ්ඵල බවත් ධාතු යුග්මයේ පහසින් පවිත්‍ර වන බවත් රජු සිය ඇමති ගණයාට දන්වා යැවීම තුළින් රාජත්වය පිරිපුන් වීමට දළදාව හා පාදාවේ ආශීර්වාදය අවශ්‍ය බව එමගින් මතුකරලයි. දළදාව හා පාදාව පොළොන්නරුවට වැඩම කරවන අවස්ථාවේ රජුම පෙර ගමන් කොට දෝතින් පිළිගෙන ඔහු විසින්ම පෙරහැරේ වැඩම කරවාගෙන ඒම ද රාජත්වයට වඩා ධාතු යුග්මයේ ඇති ගෞරවණීයත්වය මතු කිරීමකි. සිය මැඳුර ආසන්නයේ ධාතු මන්දිර පිහිටුවා ගැනීමට කටයුතු කිරීම තුළින් නිරතුරුව දළදාවේ හා පාදාවේ ආශීර්වාදය ලබා ගැනීමට මෙන්ම එහි ආරක්ෂකයා තමා බව පෙන්වීමටත් දැහැමි බව නිරතුරුව ඉස්මතු කිරීමටත් ඉඩකඩ පාලකයාට ලැබිණි. ඒ ඔස්සේ රාජත්වය හා දළදාව හා පාදාව අතර පැවති සම්බන්ධය වඩාත් සමීප කරලීමක් වූ අතර අගනගරය බුදුරජාණන් වහන්සේ වැඩ සිටින රජුන් වෙසෙන ශුද්ධ නගරයක්ය යන ආකල්පය ජනතාව තුළ ඇති කරලීම කෙරෙහි ද ඉවහල් වූ බව පැහැදිලිය. නිශ්ශංමල්ල රජු විසින් ද දළදා වහන්සේ වෙනුවෙන් එහි ආරක්ෂාව පතා දින හැටකින් හැටදාගෙය නම් ශිලාමය මන්දිරයක් කරවා එහි කොත රනින් නිම කළ බව පූජාවලිය කියයි (පූජාවලිය 1930: 734). පසුව මනරම් ප්‍රාසාදයක් වූ නිශ්ශංක ලතා මණ්ඩපයට වැඩමවා මහජන ප්‍රදර්ශනයක් ද පවත්වා තිබේ (Epigraphia Zeylanica, Vol. II, 1929: 87). එමෙන්ම සිය පුත් වූ වීරබාහු මහාදිපාදයන් හා දූ කුමරිය වූ සර්වාංග සුන්දරිය ද දළදා වහන්සේ විෂයෙහි පූජා කරන ලද බව හා ඔවුන් මුදවා ගැනීම පිණිස ස්වර්ණමය දාගැබක් බඳවන ලද බව ද රාජාවලිය මෙන්ම නිශ්ශංමල්ලගේ අභිලේඛනවල සඳහන්ව ඇත (රාජාවලිය 1976: 68; Epigraphia Zeylanica, Vol. II, 1929: 93). සිය දරුවන් දළදාව වෙත පිදීම තුළින් පාලකයා සිය බැතිමත් බව එමගින් ප්‍රදර්ශනය කළ අතරම

මීළඟට රජ වන පුද්ගලයා දළදා වහන්සේ වෙත පූජා කල පුද්ගලයෙකු වීම රාජත්වය තවදුරටත් දළදා වහන්සේට ළඟා වන අතර දළදා වහන්සේ වෙනුවෙන් නැතහොත් බුදුරදුන් වෙනුවෙන් පාලනයකට පත් වන තැනැත්තෙකුය යන අදහසක් ද එමගින් මතු කෙරේ. එමෙන්ම ලීලාවතී රැජිණ දවස දාඨාවංසය ලිවීම ද සුවිශේෂිතය (දාඨාවංසය 1914: ගා. 6-10). මීට පෙර හෙළ බසින් මෙවැනි ග්‍රන්ථ පැවැතිය ද මෙම ග්‍රන්ථ සැම ජනයාටම හිත සුව පිණිස මාගධී බසින් ලියමි යැයි දැක්වීම ද වැදගත් කරුණක් එමගින් පෙන්වා දෙයි. එනම් මෙම අවධිය වනවිට දේශීය පාලක පිරිස් අතර මෙන්ම විදේශීය කණ්ඩායම් අතර දළදා වහන්සේ සම්බන්ධව පැවති ආකල්පය හා ගෞරවණීයත්වය කෙතෙක් ද යන්න නිගමනය කිරීමට ද එමගින් අවස්ථාව සැලසේ. දඹදිව පාලක පිරිස් දළදාව ආරක්ෂා කළ අයුරුත් ශ්‍රී ලංකාවට වැඩමවීම හා කිත්සිරිමෙවන් රජු ඊට දක්වන ලද උපහාරය ගැනත් ඇති තොරතුරු මගින් මෙරට පාලකයනට ආදර්ශයක් සපයනු ලැබූ අතර දළදා වහන්සේගේ ආශ්චර්යාත්මක බව ද ඒ තුළින් තව දුරටත් ඔපවත් කර තිබේ.

නිශ්ශංකමල්ල රජුගෙන් පසු පාලනයට පත් පිරිස් බලය අරබයා වැඩි අවධානයක් යොමු කිරීම නිසා දේශපාලන ව්‍යාකුලත්වයක් පොළොන්නරුව යුගයේ අවසාන භාගයේ දැකගත හැකිය. මෙම දේශපාලන ව්‍යාකුලත්වයත් දුර්වල පාලක පිරිස් නායකත්වයට පත්වීම හා කාලිංග මාඝගේ ආක්‍රමණයත් නිසා ආරක්ෂාව පතා දළදා වහන්සේ පොළොන්නරුවෙන් බැහැර ප්‍රදේශයකට වැඩම කරවීමට භික්ෂූන් විසින් කටයුතු යෙදිණි. පරාක්‍රම පණ්ඩු රජු සතුව පැවති දළදා වහන්සේ උත්තරමූල නිවැසි වාචිස්සර නම් භික්ෂුවක් විසින් මෙම අවස්ථාවේදී කොත්මලේ ප්‍රදේශයට ගෙන ගොස් භූගතව සඟවා තබා ඉන්දියාවට සරණාගතයෙකු ලෙසින් පලාගිය බව දැක්වේ (ඌනපූරණසහිතො මහාවංසො 79:17-18). මාඝ ආක්‍රමණ නිසා පොළොන්නරුව අතහැර පැමිණි භික්ෂූහු දළදා පාදා රැගෙන මායා රටට පැමිණිය ද එහි ආරක්ෂාව මඳව ගියෙන් කොත්මලේ එක් තැනෙක එම වස්තුහු නිධන් කොට චෝළ හා පාණ්ඩ්‍ය

රටවලට ගිය බව පූජාවලියේ හා මහාවංසයේ දැක්වේ (පූජාවලිය 1930: 735; ඌනපූරණසහිතො මහාවංසො 1959: 79:19-22).

පොළොන්නරුව සමයෙහිදී දළදා වහන්සේ පිළිබඳ විශ්වාස හා ඇදහිලි වැදගත් වූ අතර දළදා වහන්සේ පාලකයෙකුට අයත් වීම රාජ්‍යමය වශයෙන් නීතිමය උරුමයක් තිබෙන බවට සම්මතයක් ද එමගින් ගොඩනැගිණි. දළදා වහන්සේ ජීවමාන වූ බුදුරජාණන් වහන්සේ ලෙසින් සැලකුණ අතර බෞද්ධාගම පිළිබඳව තමාගේ ඇති දැඩි භක්තිය ප්‍රදර්ශනය කිරීමක් ද ඒ තුළින් ප්‍රදර්ශනය විය. හොඳ නරක විනිශ්චයට හා පාලනයට මෙන්ම නිසි කලට වැසි ලබා දීමට ද අස්වැන්නේ සශ්‍රීකත්වය ඇති කිරීමට ද රජවරුන්ට අපූර්ව මායා බලයක් ඇතිය යන්න අතීතයේ සිටම විශ්වාස කළ කරුණකි (ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පළමුවැනි කාණ්ඩය, පළමුවැනි භාගය 2001: 230). දළදා වහන්සේ කේන්ද්‍ර කරගෙන සිය පාලන කටයුතු ගෙනයාම හා දැහැමි බව වඩාත් අර්ථ ගැන්වෙන පරිද්දෙන් දළදාව හා පාදාව මුල් කොට පාලකයන් ක්‍රියා කිරීම තුළින් මෙම අර්ථය යථාර්ථයක් බවට පත් කළ හැකි බවත් එමගින් තමා පිළිබඳව ජනතා විශ්වාසය එපරිද්දෙන්ම ඉටු කළ හැකි බවත් පාලකයන් විශ්වාස කළ බවක් පෙනේ. එමෙන්ම අති පූජනීය වස්තුවක් වූ දළදා වහන්සේ සම්බන්ධ වූ සාම්ප්‍රදායික කටයුතු මනාව ඉටු කරමින් ඊට නිසි ආරක්ෂාව සැලසීම මත භික්ෂූන්ගේ හා මහ ජනතාවගෙන් පාලකයාට ලැබුණ සහාය ඔහුට බියෙන් හා සැකෙන් තොරව රට පාලනය කිරීමට මහත් ආශීර්වාදයක් මෙන්ම ශක්තියක් ද විය. එමෙන්ම දළදාව සමඟ බැඳෙන ජනතාව ඊට රැකවරණය ලබා දෙන පාලකයා රැකීම ද අනෙක් අතින් යුතුකමක් ලෙසින් සැලකීය. ඒ අනුව පාලකයාට අවශ්‍ය රැකවරණයත් ජනතා අනුග්‍රහයත් ලැබුණු අතරම ජනතාව තුළින් පාලකයාට එරෙහිව ගොඩනැඟෙන විරෝධතා යම් ප්‍රමාණයකට අවම කර ගැනීමකට ද අවස්ථාවක් සැලසිණි. මෙම අදහස පසු කාලය දක්වාම මෙරට දේශපාලන නායකත්වය හැඩගැස්වීම කෙරෙහි ඍජුවම බලපාන ලද බව ඓතිහාසිකව විමර්ෂණය කරන විට පෙනී යන කරුණකි.

## නිගමනය

රාජත්වය සංඝයා විසින් පිරිනමන ලද නිලයක් ලෙස සලකනු ලැබීමේ සංකල්පය රජුගේ බලය හීන කර ලීමේ සාධකයක් ද වූ බව ගුණවර්ධන සඳහන් කරයි (ගුණවර්ධන 1993: 180). ඒ වනාහි රජු සංඝයා මත රඳා පවත්නා පුද්ගලයෙකු බවට පත් කිරීම නිසාය. දකුණු ආසියාවේ පසුකාලීන බෞද්ධ රජවරුන් සමග සංසන්දනය කරන කල ලාංකික රජවරුන් තමන් රට පාලනය කිරීමේ ස්වාභාවික අයිතියක් හිමිව සිටි නැවත උපන් බෞද්ධ දෙවියන් හෝ බුදුවරුන් බවට හිමිකම් ඉදිරිපත් නොකිරීම අපූර්ව දෙයක් සේ පෙනේ. න්‍යායික වශයෙන් රජකමේ බලය සහ තත්ත්වය සංඝයාත් රජුත් එකඟ වීම මත රඳා පැවති බැව් පෙනේ. පොළොන්නරු යුගයේ රාජත්වය සහ භික්ෂුත්වය අතර පැවති සබඳතාව විමර්ශනය කිරීමේදීත් මෙම කාරණය පැහැදිලි වුණි. එසේ වුවත් සංඝයාගේ තත්ත්වය රජුගේ තත්ත්වය අභිබවා යෑමට සමත් නොවීම වැදගත් කරුණකි. එක් තනි නායකයෙකු නොසිටීමත් සංඝ සමාජය තරඟකාරී කට්ටි කීපයකට බෙදී තිබීමත් එහි අධිකාරී බලය හීන වීමට හේතු වූ සාධක විය. භික්ෂූන්ගේ ජීවිත හැසිර වීමෙහි ලා බල පෑ විනය නීති මගින් භික්ෂූන් දේශපාලන අධිකාරී බලය කෙලින්ම තමන් අතට ගැනීමෙන් වලක්වනු ලැබිණි. මෙම නීති නොතකා හැරීමට භික්ෂූන් තීරණය කළත් ශාසනයේ ආරක්ෂකයා වශයෙන් ඒවා බලෙන් ක්‍රියාත්මක කිරීමට රජුට පුළුවන් විය. තව ද විහාරවලට අයත් දේපළ රාජ සන්තක කිරීමේ හා විහාරස්ථ වරප්‍රසාද අවලංගු කිරීමේ හැකියාව සංඝයා රජුට විරුද්ධව ප්‍රසිද්ධියේ අභියෝග කිරීම වලක්වා ලූ සාධකයක් වන්නට ඇතැයි අදහස් කළ හැකිය. මේ ආදී කරුණු නිසා සංඝයාට රාජ්‍ය කටයුතු තමන්ට රුචි පරිදි මෙහෙයවීම සඳහා අධිකාරි බලයක් ලබා ගත හැකි එකම මාර්ගය වූයේ තම නියෝජිතයන් රජසුනට පත් කිරීමයි. භික්ෂූන් තම නඩත්තුව සඳහා ද තම දේපළ රැක ගැනීම සඳහා ද රඳා පැවතුණේ රජුගේ අනුග්‍රහය මතය. සංඝයාත් රජුත් අතර වූ මේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව ලාංකීය සමාජයෙහි බල තුලනය රැක ගැනීමට ඉවහල් වූ වැදගත් සාධකයක් සේ පෙනේ. එමගින් මෙම

ආයතන දෙකම ඔවුනොවුන් මත පමණට වැඩියෙන් තම අධිකාරි බලය හෝ ආධිපත්‍යය ව්‍යාප්ත කිරීමෙන් වලක්වනු ලැබිණ. පොළොන්නරු යුගය වන විට බුද්ධ ශාසනය පිහිටුවා ශත වර්ෂ ගණනාවක් ගත වීම ද රාජ්‍යත්වය එහි උපරිම තත්ත්වයකට ද පත් වී තිබුණි. බුද්ධාගමෙන් ඇති කරන ලද සංස්කෘතික සම්බන්ධතා ප්‍රාදේශීය දුරස්ථ බව අවම කරලීමටත් ජනතාවගේ චින්තනය අවධි කරලීමටත් බලපෑවේය. එසේම ලේඛන සම්ප්‍රදාය සහ භාෂාව වඩාත් හරවත් ලෙසින් උපයෝගී කර ගැනීම තුළින් සන්නිවේදනයේ පොදු බවක් ඇති වූවාක් මෙන්ම රටේ ජනතාව අතරේ සමීප බවක් ගොඩනැගීමටත් බෞද්ධ සංස්කෘතියෙන් ඇති කරනු ලැබූ පදනම වැදගත් විය. බුද්ධාගම මගින් ඇති කරනු ලැබූ පසුබිම ජනතාව අතර සංස්කෘතික වශයෙන් එක්සත් බවක් ඇති වීම කෙරෙහි බලපෑ අතර එම තත්ත්වය එක්සත් පාලන රටාවකට ඔවුන් යොමු කරලීමට අදාළ මානසිකත්වයට හා ක්‍රියාකාරිත්වයට ද ඍජුව හා වක්‍රාකාරයෙන් බලපෑ බව පෙනේ. දේශපාලන සංවිධානය වර්ධනයවීමෙන් පසුද පාලන සංවිධානය හා පාලන නායකත්වය හැඩ ගැසීම උදෙසා ආගම තුළින් සුවිශේෂ දායකත්වයක් ලැබුණි. ආගමික සංකල්ප මගින් දේශපාලන සංවිධානයක ක්‍රියාකාරිත්වය හැඩ ගස්වා ගැනීමට ආදර්ශයන් හා උපදේශයන් ලබා ගත හැකි විය. එමෙන්ම ආචාර ධර්මවලින් පාලන නායකත්වය පෝෂණය කරලීමට ද අවස්ථාවක් ද සැලසිණි. මීට අමතරව පාලකයාගේ හා පාලන සංවිධානයේ අධිකාරි බලය ජනතාව අතරට ගෙන යාමට ආගම හොඳ පසුබිමක් විය. භික්ෂූන් කෙරෙහි මෙන්ම ආගමික ස්ථානවලට පරිත්‍යාගයන් කරමින් ශාසනයේ දියුණුව උදෙසා පොළොන්නරු යුගයේ පාලකයන් ගත් ක්‍රියා මාර්ග වක්‍රාකාරයෙන් ඔහුගේ පාලන බලය ශක්තිමත්වීම කෙරෙහි බලපෑවේය. පොළොන්නරුවෙන් ඈත ප්‍රදේශයන්හි ද පරිත්‍යාග කිරීමෙන් ඒ ඒ ප්‍රදේශවල තම බලය තහවුරු වී පැවැති බව පෙන්වාදීමක් විය. මෙම පරිත්‍යාගයන් කිරීමේදී අභිලේඛන පිහිටුවමින් තමාගේ බලය ජනතාවට නිතර දැක්වීමට බලාපොරොත්තු වූ බවක් ද පෙනේ. පාලකයාගේ මෙම ක්‍රියාවන් පාලකයා කෙරෙහි සුභවාදී හැඟීමක් භික්ෂූන් තුළ මෙන්ම වැසියන් තුළත් ඇති වීමට බලපෑ අතර දේශපාලන වශයෙන්

එල්ලවන විරෝධතා අවම කර ගැනීමට ද මාර්ගයක් විවර වූ බව ද පැහැදිලිය. ආගම හා දේශපාලකයා අතර ගොඩනැගෙන මෙම සම්බන්ධතා පාලකයාගේ බලය හා අධිකාරිත්වය ඉස්මතු කිරීමට හේතු වූවාක් මෙන්ම ඔහුගේ බලය ඇතැම් විට සීමාවීමට ද බලපෑ බව කිව හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය - සිංහල සහ පාලි

*අභිධම්මත්ථ විකාසිනී* (1961). (සංස්). ඒ. පී. බුද්ධදත්ත හිමිල කොළඹ.

*ඌනපූරණසහිතො මහාවංසො* (1959). (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*දාඨාවංසය* 1914 (සංස්.). හලවේගොඩ සීලාලංකාර හිමි, අලුත්ගම: සද්ධර්ම ප්‍රකාශක යන්ත්‍රාලය.

*නිකාය සංග්‍රහය* (1955). (සංස්.). ඩී. පී. ආර්. සමරනායක, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

*පූජාවලිය* 1930. (සංස්.). බෙන්තර සද්ධාතිස්ස හිමි, පානදුර.

*රාජාවලිය* (1953). (සංස්.). බී. ගුණසේකරල කොළඹ.

*රාජාවලිය* 1976. (සංස්.). ඒ. වී. සුරවීරල කොළඹ: ලේක්හවුස්.

*සාරත්ථදීපනී* 1933. (සංස්.). මාබෝපිටියේ මේධංකර හිමි, කොළඹ.

## Primary Sourses- English- Inscriptions

*Ancient Inscriptions of Ceylon 1833*. (ed.). E. Muller, London: Trubner.

*Ceylon Journal of Science, Section G. Vol. I*. 1924. Colombo: The Archaeological Commissioner.

*Ceylon Journal of Science, Section G. Vol. II*. 1930. (ed.). S. Paranavitana, Colombo: The Archaeological Commissioner.

*Epigraphia Zeylanica, Vol. I*, (1912). (ed.). D. M. de Z. Wickramasinghe, London: Oxford University Press.

*Epigraphia Zeylanica, Vol. II*, (1929). (ed.). D. M. de Z. Wickramasinghe, London: Oxford University Press.

*Epigraphia Zeylanica, Vol. III*, (1933). (ed.). S. Paranavitana, Colombo: Department of Archaeology.

*Epigraphia Zeylanica, Vol. IV*, (1934). (ed.). S. Paranavitana, London: Oxford University Press.

*Epigraphia Zeylanica, Vol. V*, (1955). (ed.). S. Paranavitana, Colombo: Department of Archaeology

## ද්විතීයික මූලාශ්‍රය - සිංහල

ගුණවර්ධනල රණවීර (1993). *සිවුර සහ නඟුල*, මධ්‍යතන යුගයේ මුල් භාගය තුළ ශ්‍රී ලංකාවේ විහාරස්ථ ජීවන සම්ප්‍රදාය හා එහි ආර්ථික පාර්ශ්වයන් පිළිබඳ අධ්‍යයනයක්, කොළඹ: සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

ගුණවර්ධන, ආර්. ඒ. එල්. එච්. (2022). *Periodization in Sri Lankan History, Some Reflections with Special Emphasis on the Development of the State*, ශ්‍රී ලංකා ඉතිහාසයේ යුග බෙදීමල රාජ්‍යය වර්ධනය පිළිබඳ විශේෂ අවධාරණයට ලක් වූ අදහස් ගොනුවක් (පරි.). එන්. ඒ. විමලසේන, කර්තෘ ප්‍රකාශනයකි.

ධම්මවිසුද්ධි ස්ථවිර, යටදොළවත්තේ (1997). ‘‘පොළොන්නරු යුගයේ ආගමික තත්ත්වය,’’ *පොළොන්නරු ලිපි සංහිතා*, (සංස්.) ඩී. එම්. ගුණරත්න, ටියුරින් අබේවික්‍රමල කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 52-77 පිටු.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත, පී. බී. මීගස්කුඹුර, එච්.එම්.ආර්.ඩී. හේරත් (සංස්.) (2013). කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

පණ්ඩිත, වින්සන්ට් (1962). ‘‘පොළොන්නරු යුගයේ බෞද්ධ තත්වය,’’ *පොළොන්නරු යුගය*, (සංස්.) ඇස්. ඩී. සපරමාදු, කොළඹ: තිසර පොත් ප්‍රකාශකයෝ, 132-151 පිටු.

පුඤ්ඤරතන හිමි, හාන්දුපැල්පොල (1964). *පොළොන්නරු යුගයේ ලංකාව*, කොළඹ: රත්නාවලී ප්‍රකාශකයෝ.

රෝහණධීර, මැන්දිස් (1998). *නිශ්ශංකමල්ල*, මහරගම: තරංජි ප්‍රින්ට්ස්.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය, පළමු භාගය* (2001). (සංස්.) සර් නිකලස් ආටිගල, ඩබ්. ජේ. එෆ්. ලැබ්රෝයි, සී. ඩබ්. නිකලස්, සෙනරත් පරණවිතාන, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය, දෙවන භාගය* (1972). (සංස්.) සර් නිකලස් ආටිගල, ඩබ්. ජේ. එෆ්. ලැබ්රෝයි, සී. ඩබ්. නිකලස්, සෙනරත් පරණවිතාන, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

ලියනගමගේ, අමරදාස සහ රණවීර ගුණවර්ධන (සංස්.) (2014). *අනුරාධපුර යුගය*, කොළඹ: සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

වජිර, කුඹුරුගමුවේ (2008). *දළදා ඉතිහාසය හා සංස්කෘතිය*, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සංඝරතන හිමි, රස්නකවැවේ (සංස්.) 2013. *ඥානෝදීපනී*, අනුරාධපුර: ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති ධර්ම පුස්තකාලය.

## Secondary Sources - English

Gunawardana, R. A. L. H. (1979). *Robe and Plough, Monasticism and Economic Interest in Early Medieval Sri Lanka*, Tucson and Arizona: The University of Arizona Press. (Composed by Wesley Press, Colombo).

Gunawardana, R. A. L. H. (2008). *Periodization in Sri Lankan History, Some Reflections with Special Emphasis on the Development of the State*, Colombo: Social Scientist's Assosiation.

Harvey, G. E. (1925). *History of Burma*, London.

*History of Ceylon, University of Ceylon, Vol. I, Pt. II*, (1960). (eds.). Sir Nicholas Attigalle and Others, Peradeniya: Ceylon University Press.

Malalasekera, G. P. (1958). *The Pali Literature of Ceylon*, Colombo: M. D. Gunasena & Co., LTD.

Pathmanathan, S. (2019). *Tamil Inscriptions in Sri Lanka, Vol. I,* Colombo: Department of Hindu Religious and Cultural Affairs.